## 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත (සංශෝධිත) වෙත යෝජිත නව සංශෝධන

| වගන්තිය | දැනට පවතින විධිවිධානය | යෝජිත විධිවිධානය |
|---|---|---|
| 1 | මෙම පනත 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි (මෙහි මින් මතු "නියමිත දිනය"යනුවෙන් සඳහන් කරනු ලබන) යම් දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය. | ***වෙනසක් නොමැත.*** |
| 2 | 44 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, නියමිත දින පටන් හෝ ඉන් පසුව, කිසිම තැනැත්තකු විසින් කල්බදු මූල්‍යකරණ ව්‍යාපාර කටයුතු කර ගෙන යාමෙහි නිරතවීම, මේ පනතේ විධිවිධාන යටතේ තත්කාර්ය සඳහා නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකයක අධිකාරිය යටතේ හැර කරනු නොලැබිය යුතු ය. | ***අහෝසි කෙරේ.*** |
| 3 | යම් තැනැත්තෙක්-<br><br>(අ) 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූලව බලපත්‍රලත් වාණිජ බැංකුවක් හෝ බලපත්‍රලත් විශේෂිත බැංකුවක් වන්නේ නම්;<br><br>(ආ) 1988 අංක 78 දරන මුදල් සමාගම් පනතේ අර්ථානුකූලව මුදල් සමාගමක් නම් ; හෝ<br><br>(ඇ) නියමිත පරිදි වූ අවම නිකුත් කළ හා ගෙවා නිමි ප්‍රාග්ධනය ඇති, 1985 අංක 17 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද පොදු සමාගමක් වන්නේ නම්,<br><br>මිස, ඒ තැනැත්තා මේ පනත යටතේ ලියාපදිංචි වීමට සුදුස්සෙක් නොවන්නේ ය. | ***අහෝසි කර ප්‍රතිස්ථාපනය කෙරේ.***<br><br>(අ)1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූලව තුළ බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් ;<br><br>(ආ) 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ අර්ථානුකූලව බලපත්‍රලාභී මුදල් සමාගමක්; හෝ<br><br>(ඇ) ක්ෂුද්‍ර මූල්‍ය කල්බදු ව්‍යාපාර පවත්වා ගෙන යෑම සඳහා දැනට ක්‍රියාත්මක වන ඕනෑම ලිඛිත නීතියක් යටතේ අවසර දී ඇති වෙනත් ඕනෑම ආයතනයක්;<br><br>හැර, අන් කිසිදු පුද්ගලයෙකු කල්බදු මූල්‍යකරණ ව්‍යාපාර පවත්වා ගෙන නොයා යුතුය. |
| 4 | (1) මේ පනත යටතේ ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලීමක්, ඒ කාර්යය සඳහා අධ්‍යක්ෂවරයා විසින් සපයනු ලබන යම් ආකෘතියකට අනුව අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එය - | *අහෝසි කෙරේ.* |

(අ) බලපත්‍ර ලත් වාණිජ බැංකුවක් හෝ බලපත්‍ර ලත් විශේෂිත බැංකුවක් සම්බන්ධයෙන් වන විට, 1988 අංක 30 දරන බැංකු පනත යටතේ මුදල් මණ්ඩලය විසින් ඒ බැංකුව වෙත නිකුත් කරන ලද්දා වූ ද ඉල්ලීම කරනු ලබන දින වන විට බලාත්මකව පවතින්නා වූ ද බලපත්‍රයේ සහතික කළ පිටපතක් ;

(ආ) මුදල් සමාගමක් සම්බන්ධයෙන් වන විට, 1988 අංක 78 දරන මුදල් සමාගම් පනත යටතේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද්දා වූ සහ ඉල්ලීම කරනු ලබන දින වන විට බලාත්මකව පවතින්නා වූ ද බලපත්‍රයේ සහතික කළ පිටපතක් ;

(ඇ) 3 වන වගන්තියේ (අ) සහ (ආ) ඡේදවල සඳහන් කරන ලද ඒවා නොවන පොදු සමාගමක් සම්බන්ධයෙන් වන විට -

(i) සමාගමේ සාංගමික සංස්ථා පත්‍රයේ හා ව්‍යවස්ථාවලියේ සහතික කළ පිටපතක් ; සහ

(ii) සමාගම සංස්ථාගත කිරීමේ සහතිකයේ සහතික කළ පිටපතක් ;

(ඈ) 7 වන වගන්තියේ සඳහන් විස්තර ඇතුළත් මෙහෙයුම් සංග්‍රහයේ සහතික කළ පිටපතක් ;

(ඉ) නියමිත පරිදි ඉල්ලුම්පත්‍ර ගාස්තුව ; සහ

(ඊ) නියම කරනු ලැබිය හැකි වෙනත් යම් ලේඛනවල සහතික කළ පිටපත්, සමග එවිය යුතු ය.

(2) ඉල්ලීම නිශ්චය කිරීම සඳහා අවශ්‍ය යයි තමා සලකන අවස්ථාවක, යම් වැඩිදුර තොරතුරු හෝ විස්තර සපයන ලෙස අධ්‍යක්ෂවරයා විසින් ඉල්ලුම්කරුට නියම කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලීමක හෝ සපයන ලද ලේඛනයක නැතහොත් (2) වන උපවගන්තිය යටතේ සපයන ලද තොරතුරක හෝ විස්තර කිසිවක තම දැනීමට අනුව අසත්‍ය හෝ සැලකිය යුතු විස්තර කිසිවක් සම්බන්ධයෙන් නොමඟ යවන සුළු යම්

| | | |
|---|---|---|
| | ප්‍රකාශයක් කරන තැනැත්තකු, මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතුය. | |
| 5 | (1) 4 වන වගන්තිය යටතේ කරන ලද ඉල්ලීමක සහ සපයන ලද ලේඛනවල, තොරතුරක හෝ විස්තරවල ඇතුළත් තොරතුරු සැලකිල්ලට ගැනීමෙන් සහ අවශ්‍ය යැයි අධ්‍යක්ෂවරයා සලකන යම් විමර්ශනයක් කිරීමෙන් පසුව, කල්බදු මූල්‍යකරණ ව්‍යාපාර කටයුතු කර ගෙන යාමට ඉල්ලීම්කරු සුදුසු හා යෝග්‍ය බවට අධ්‍යක්ෂවරයා සෑහීමට පත් වන අවස්ථාවක, ජාතික ආර්ථිකයේ යහපත සැලකිල්ලට ගනිමින්, අධ්‍යක්ෂවරයා විසින් -<br><br>(අ) ඉල්ලුම්කරු ලියාපදිංචි කරනු ලැබිය හැකි ය; තව ද<br><br>(ආ) ඉල්ලුම්කරු වෙත ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කරනු ලැබිය හැකි ය.<br><br>(2) (1) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි කරන ලද සෑම තැනැත්තෙක් ම (මෙහි මින් මතු "ලියාපදිංචි කරන ලද ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) "ලියාපදිංචි කරන ලද කල්බදු මූල්‍යකරණ ආයතනයක්" වශයෙන් සඳහන් කරනු ලැබිය යුතු ය.<br><br>(3) සෑම ලියාපදිංචි කරන ලද ආයතනයක් විසින් ම, ආයතනය වෙත නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකය, ඒ ආයතනයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානයෙහි ප්‍රකටව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කළ යුතු ය.<br><br>(4) අධ්‍යක්ෂවරයා විසින් සෑම ලියාපදිංචි කරන ලද ආයතනයක් පිළිබඳ ලේඛනයක් නියමිත ආකෘතියකට අනුව තබා ගෙන පවත්වා ගෙන යනු ලැබිය යුතු ය. | *අහෝසි කෙරේ.* |

| | | |
|---|---|---|
| 6 | සෑම ලියාපදිංචි කරන ලද ආයතනයක් විසින් ම එක් එක් ලිත් වර්ෂය අවසාන වීමෙන් මාස දෙකක් ඇතුළත, නියමකරනු ලැබිය හැකි වාර්ෂික ලියාපදිංචි කිරීමේ ගාස්තුව, අධ්‍යක්ෂවරයා වෙත ගෙවනු ලැබිය යුතුය. | *අහෝසි කෙරේ.* |
| 7 | 4 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ ඉදිරිපත් කළයුතු මෙහෙයුම් සංග්‍රහයේ -<br><br>(අ) කල්බදු මූල්‍යකරණයක් පවත්නා කාල පරිච්ඡේදය;<br><br>(ආ) කල්බදු මූල්‍යකරණයක් මත අයවීමට ඇති ගෙවීම් ආපසු අයකර ගැනීමේ ක්‍රමය ;<br><br>(ඇ) කල්බදු මූල්‍යකරණයක් යටතේ සපයන ලද උපකරණ සම්බන්ධයෙන් වන හිමිකම් පෑමට එරෙහිව බදුගැනුම්කරුගේ අයිතිවාසිකම් බදු දීමනාකරු විසින් ආරක්ෂා කිරීම ;<br><br>(ඈ) කල්බදු මූල්‍යකරණය ඉකුත්වීමෙන් පසු ඒ උපකරණ බැහැර කරලීම; සහ<br><br>(ඉ) නියම කරනු ලැබිය හැකි වෙනත් යම් තොරතුරුවලට<br><br>අදාළ විස්තර ඇතුළත් විය යුතු ය. | *අහෝසි කෙරේ.* |
| 8 | අධ්‍යක්ෂවරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය ඇතිව හැර, ලියාපදිංචි කරන ලද ආයතනයක් විසින් —<br><br>(අ) 4 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි (ඇ) ඡේදය යටතේ, ඉදිරිපත් කරන ලද මෙහෙයුම් සංග්‍රහයේ ඇතුළත් විස්තර වෙනස් කිරීම හෝ ඉන් බැහැර වීම; හෝ<br><br>(ආ) ඒ ආයතනය සමාගමක් වන අවස්ථාවක, එහි සාංගමික සංස්ථා පත්‍රය හා ව්‍යවස්ථාවලිය වෙනස් කිරීම,<br><br>කරනු නොලැබිය යුතු ය. | *අහෝසි කෙරේ.* |

| | | |
|---|---|---|
| 9 | (1) පහත දැක්වෙන යම් එක් හේතුවක් හෝ එවැනි හේතු වැඩි ගණනක් මත, ලියාපදිංචි කරන ලද ආයතනයක ලියාපදිංචි කිරීම අධ්‍යක්ෂවරයා විසින් අත්හිටුවනු ලැබීම හෝ අවලංගු කරනු ලැබීම කළ හැකි ය:—<br><br>(අ) ලියාපදිංචි කිරීමෙන් මාස දොළහක් ඇතුළත ව්‍යාපාරික කටයුතු ආරම්භ කිරීමට අපොහොසත්වීම;<br><br>(ආ) කල්බදු මූල්‍යකරණ ව්‍යාපාර කටයුතු කර ගෙන යාම නතර කිරීම;<br><br>(ඇ) ස්වකීය ණය හිමියන් සමඟ යම් ණය සම්මතයකට හෝ වැඩ පිළිවෙලකට එළඹීමට යෝජනා කිරීම හෝ එසේ කර තිබීම, නැතහොත් ඇවරකර තිබීම හෝ ගණන් බේරා වසා දමා තිබීම හෝ අන්‍යාකාරයෙන් විසුරුවා හැර තිබීම;<br><br>(ඈ) ස්වකීය බදු ගැණුම්කරුවන්ගේ යහපතට හානිකර විය හැකි ආකාරයකින් ස්වකීය ව්‍යාපාර කටයුතු කර ගෙන යාම;<br><br>(ඉ) අවස්ථාවෝචිත පරිදි, බදු ගැණුම්කරුවන්, ණයහිමියන් හෝ සැපයුම්කරුවන් කෙරෙහි ඇති ස්වකීය බැඳීම් ඉටු කිරීමට නොහැකි වීම;<br><br>(ඊ) මේ පනතේ විධිවිධාන කිසිවක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ මේ පනත හෝ ඒ නියෝගය යටතේ අධ්‍යක්ෂවරයා විසින් පනවන ලද යම් කොන්දේසියක් හෝ දෙන ලද විධාන කිසිවක් කඩකරමින් ක්‍රියා කිරීම;<br><br>(උ) ලියාපදිංචි කිරීම සඳහා වූ ස්වකීය ඉල්ලීමෙහි අසත්‍ය, නොමඟ යවන සුලු හෝ වැරදි සහිත තොරතුරු සැපයීම හෝ වැදගත් කරුණු හෙළි කිරීම, වසන් කිරීම හෝ එසේ කිරීම පැහැර හැරීම; හෝ<br><br>(ඌ) ඒ ආයතනය බලපත්‍රලත් වාණිජ බැංකුවක්, බලපත්‍රලත් විශේෂිත බැංකුවක් හෝ බලපත්‍රලත් මූල්‍ය සමාගමක් වන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, 1988 අංක 30 දරන බැංකු පනත හෝ 1988 අංක 78 දරන මුදල් සමාගම් පනත යටතේ, ඒ බලපත්‍රය නිකුත් කරන ලද අධිකාරිය විසින් ඒ ආයතනය වෙත නිකුත් කරන ලද බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ට කිරීම. | *අහෝසි කෙරේ.* |

| | | |
|---|---|---|
| | (2) (1) වන උපවගන්තියේ සඳහන් හේතු එකක් හෝ වැඩි ගණනක් මත, අධ්‍යක්ෂවරයා විසින්—<br><br>(අ) මාස තුනක් නොඉක්මවන, නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් කාල පරිච්ඡේදයක් සඳහා ලියාපදිංචි කරන ලද ආයතනයක ලියාපදිංචි කිරීම අත්හිටවනු ලැබිය හැකි අතර, අත්හිටුවීමේ කාල පරිච්ඡේදය තුළදී එම ආයතනය යම් කල්බදු මූල්‍යකරණයකට ඇතුළත් නොවිය යුතු ය ; නැතහොත්<br><br>(ආ) ලියාපදිංචි කරන ලද ආයතනයේ ලියාපදිංචි කිරීම අවලංගු කරනු ලැබිය හැකි අතර, ආයතනය විසින්, ඉන් පසුව, අවලංගු කිරීම බලාත්මක වූ දිනට පෙර ඇතුළත් වූ යම් ව්‍යාපාර කටයුත්තක් හැර, යම් කල්බදු මූල්‍යකරණ ව්‍යාපාර කටයුත්තක් නොකළ යුතු ය. තව ද, එසේ ඇතුළත් වී තිබුණු ව්‍යාපාර කටයුතු අවසන් කිරීමේ කාර්යය සඳහා එම ආයතනය ලියාපදිංචි කරන ලද ආයතනයක් වශයෙන් සලකනු ලැබිය යුතු ය. | |
| 10 | (1) 9 වන වගන්තියේ සඳහන් හේතු එකක් හෝ ඉන් වැඩි ගණනක් මත ලියාපදිංචි ආයතනයක ලියාපදිංචි කිරීම අත්හිටුවීමට හෝ අවලංගු කිරීමට පෙර, ඒ බව දැනුම්දෙමින් හා අත්හිටුවීමට හෝ අවලංගු කිරීමට හේතු සඳහන් කරමින් ලියවිල්ලකින් වූ දැන්වීමක් අධ්‍යක්ෂවරයා විසින් ආයතනය වෙත භාර දෙනු ලැබිය යුතු ය.<br><br>(2) ලියාපදිංචි කරන ලද ආයතනයක් විසින්, (1) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමක් ලැබීමෙන් දින දාහතරක් ඇතළත, තම ලියාපදිංචි කිරීම අවලංගු නොකළ යුත්තේ හෝ අත්හිටුවීම නොකළ යුත්තේ මන්දැයි හේතු දැක්විය හැකි ය.<br><br>(3) (2) වන උපවගන්තිය යටතේ සඳහන් කාල පරිච්ඡේදය ඇතුළත හේතු දැක්වීමට ලියාපදිංචි කරන ලද ආයතනයක් අපොහොසත් වන අවස්ථාවක, අධ්‍යක්ෂවරයා විසින්, අවස්ථාවෝචිත පරිදි, ලියාපදිංචි කිරීම අත්හිටුවනු ලැබීම හෝ අවලංගු කරනු ලැබීම කළ හැකි ය.<br><br>(4) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීමට අනුකූලව ලියාපදිංචි කරන ලද ආයතනය විසින්, නිශ්චිතව සඳහන් කාල පරිච්ඡේදය | *අහෝසි කෙරේ.* |

| | | |
|---|---|---|
| | ඇතුළත හේතු දක්වනු ලබන අවස්ථාවක, ඉදිරිපත් කරන ලද හේතු සැලකිල්ලට ගැනීමෙන් පසුව අධ්‍යක්ෂවරයා විසින්—<br><br>(අ) ස්වකීය ලියාපදිංචිය අත්හිටවීම හෝ අවලංගු කිරීම නොකළ යුතු බවට ආයතනය විසින් ප්‍රමාණවත් හේතු දක්වා ඇතැයි තමා සෑහීමකට පත් වූ අවස්ථාවක, ලියාපදිංචි කිරීම අත්හිටවීම හෝ අවලංගු කිරීම නොකරනු ලැබිය හැකි ය; නැතහොත්<br><br>(ආ) ස්වකීය ලියාපදිංචි කිරීම අත්හිටුවීම හෝ අවලංගු කිරීම නොකළ යුතු බවට ආයතනය විසින් ප්‍රමාණවත් හේතු දක්වා නැතැයි තමා සෑහීමට පත් වූ අවස්ථාවක, ලියාපදිංචි කිරීම අත්හිටුවීම හෝ අවලංගු කිරීම කරනු ලැබිය හැකි ය.<br><br>(5) (3) වන උපවගන්තිය හෝ (4) වන උපවගන්තිය යටතේ අධ්‍යක්ෂවරයාගේ තීරණය ලියාපදිංචි කරන ලද ආයතනය වෙත භාර දිය යුතු අතර, එසේ තීරණය ආයතනය වෙත භාර දුන් දින එය බලාත්මක විය යුතු ය. | |
| 11 | (1) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, කල්බදු මූල්‍යකරණයක් යටතේ බදු ගැනුම්කරුවකු වෙත සපයන ලද උපකරණවල නිරවුල් හා සාමකාමී සන්තකය බදු ගැනුම්කරුවකුට ඇති අතර, ඒ අයිතිය ආරක්ෂා කිරීම සහතික කිරීම, බදු දීමනාකරුවන්ගේ කාර්යය වන්නේ ය.<br><br>(2) බදු ගැනුම්කරුවන්ගේ යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් හේතුකොට ගෙන උපකරණයේ නිරවුල් හා සාමකාමී සන්තකයේ අයිතියට ඇති හිමිකම බදු ගැනුම්කරුට අවසන්ව ඇති අවස්ථාවක, (1) වන උපවගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු ය. | *(2) උපවගන්තිය අහෝසි කර ප්‍රතිස්ථාපනය කෙරේ.*<br><br>මෙම පනත යටතේ උපකරණවල සන්තකය ආපසු අය කර ගැනීමට බදු දීමනාකරු ක්‍රියාමාර්ග ගන්නා අවස්ථාවක දී (1) උපවගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතුය. |
| 11අ | *නව විධිවිධානය* | බදු ගැනුම්කරු විසින් එවැනි තෙවන පාර්ශ්වීය හිමිකම් යටතේ කල්බදු උපකරණ බාර ගැනීමට එකඟ වී ඇත්නම් නම් හැර, උපකරණවලට අදාළව පවතින බදු ගැනුම්කරුගේ නිහඬ භුක්තිය බැහැර කිරීමක්, අවම කිරීමක් හෝ සීමා කිරීමක් සිදු කරන තෙවන පාර්ශ්වීය හිමිකම් සඳහා බදු දීමනාකරු වගකිව යුතු ය. |

| | | |
|---|---|---|
| 12 | (අ) කල්බදු මූල්‍යාකරණය යටතේ සපයන ලද උපකරණවලට නිසි සැලකිල්ල දැක්වීම;<br><br>(ආ) එය සපයනු ලැබ ඇත්තේ යම් කාර්යයක් සඳහා ද ඒ කාර්යය සඳහා එය භාවිත කිරීම; සහ<br><br>(ඇ) සාධාරණ ගෙවීයාමකට සහ කල්බදු මූල්‍යාකරණයේ පාර්ශ්වකරුවන් විසින් එකඟවන ලද සුළු වශයෙන් වූ වෙනස් කිරීම් කිසිවකට යටත්ව, එය බදු ගැනුම්කරුට භාරදුන් තත්වයෙන්ම තබා ගැනීම,<br><br>බදු ගැනුම්කරුවකුගේ කාර්යය වන්නේ ය. | *නව අතුරු විධානය ඇතුළත් කරන්න.*<br><br>එසේ වුවද, කල්බදු කාලය තුළ දී කල්බදු උපකරණය අඛණ්ඩව හා බාධාවකින් තොරව භාවිත කිරීම තහවුරු කිරීම සඳහා බදු දීමනාකරු විසින් සෑම කල්හි බදු ගැනුම්කරු වෙත සෑම සහායක් ම ලබා දිය යුතු ය. |
| 12අ | *නව විධිවිධානය* | මෙම පනතේ 12 වන වගන්තිය සමඟ අනුකූල වීමට බදු ගැනුම්කරු අපොහොසත් වන අවස්ථාවක දී, සාධාරණ ක්ෂය වීම් සහ කල්බදු මූල්‍යාකරණයේ පාර්ශ්වයන් විසින් එකඟ වන ලද නවීකරණයන් හැර, මෙම උපකරණයට සිදු වන ඕනෑම හානියක අගය බදු ගැනුම්කරුගෙන් යථා තත්ත්වයට පත්කර ගැනීමට හෝ අය කර ගැනීමට අයිතියක් බදු දීමනාකරුට ඇත්තේ ය. |
| 13 | (1) කල්බදු මූල්‍යාකරණයක සඳහන් උපකරණයක්, එය භාරදීම සඳහා ඒ කල්බද්ද යටතේ වූ නියම කර ඇති වේලාවේ දී හෝ ඊට පෙර බදු ගැනුම්කරුවකු වෙත භාර නොදී ඇත්තා වූ, හෝ ඒ වේලාවෙන් පසු භාර දී ඇත්තා වූ අවස්ථාවක, නැතහොත්, භාරදුන් උපකරණය, ඒ උපකරණයට අදාළ සැපයුම් ගිවිසුමේ ඇතුළත් නියමවලට, කොන්දේසිවලට, ප්‍රතිඥා භාරයන්ට හෝ පිරිවිතරවලට අනුකූල නොවන අවස්ථාවක, බදු ගැනුම්කරු විසින් (2) උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, ඒ උපකරණය ප්‍රතික්ෂේප කොට ඒ කල්බදු මූල්‍යාකරණය අවසන් කරනු ලැබිය හැකි ය.<br><br>(2) බදු ගැනුම්කරුවකු විසින්, (1) වන උපවගන්තිය යටතේ කල්බදු මූල්‍යාකරණයක් අවසන් කරනු ලබන අවස්ථාවක, ඒ කල්බදු මූල්‍යාකරණය යටතේ බදු ගැනුම්කරු විසින් කරනු ලබන ගෙවීම අත්හිටුවනු ලැබිය හැකි අතර, ඒ කල්බදු මූල්‍යාකරණය යටතේ ගෙවන ලද මුදල් කිසිවක් පහත සඳහන් කරුණ සම්බන්ධයෙන් බදු දීමනාකරු විසින් අත්හිටුවාගනු ලැබූ | *වෙනසක් නොමැත.* |

| | | |
|---|---|---|
| | යම් සාධාරණ මුදලක් අඩුකර ගැනීමෙන් පසුව, බදු දීමනාකරුගෙන් ආපසු අයකර ගැනීමට තවදුරටත් ඔහුට හිමිකම ඇත්තේ ය:–<br><br>(අ) අවසන් කිරීමට පෙරාතුව, බදු ගැනුම්කරු විසින් ලබාගත් ප්‍රතිලාභ කිසිවක්;<br><br>(ආ) කල්බද්ද සම්බන්ධයෙන් බදුදීමනාකරු විසින් දරන ලද වියදම් කිසිවක්; සහ<br><br>(ඇ) බදු ගැනුම්කරුගේ පැහැරහැරීමකින් හෝ නොසලකා හැරීමකින් උද්ගතවන, උපකරණයේ වටිනාකමේ යම් හිනවීමක්.<br><br>(3) භාරදීම සඳහා නියමිත වේලාව ඇතුළත බදු ගැනුම්කරුවකු වෙත භාරදුන්, කල්බදු මූල්‍යාකරණයක සඳහන් උපකරණයක්, ඒ උපකරණයට අදාළ සැපයුම් ගිවිසුමේ ඇතුළත් නියම කොන්දේසි, ප්‍රතිඥාභාර හෝ පිරිවිතරවලට අනුකූල නොවන අවස්ථාවක හෝ, උපකරණය භාරදීම සඳහා නියමිත වේලාව ඇතුළත එය සපයනු නොලැබිය හැකි යැයි විශ්වාස කිරීමට බදු දීමනාකරුට හේතු ඇති අවස්ථාවක, සැපයුම් ගිවිසුමේ ඇතුළත් නියම, කොන්දේසි, ප්‍රතිඥාභාර හෝ පිරිවිතරවලට අනුකූලවන වෙනත් උපකරණයක් බදු දීමනාකරු විසින් බදු ගැනුම්කරු වෙත සපයනු ලැබිය හැකි අතර, කල්බදු මූල්‍යාකරණයේ අන්‍යාකාර විධිවිධාන සලස්වනු ලැබ ඇත්නම් මිස, බදු ගැනුම්කරු විසින්, බදු ගැනුම්කරු බදු දීමනාකරුගෙන් උපකරණ භාර ගැනීමට එකඟවූවාක් මෙන් සලකා, එය භාරගනු ලැබිය යුතු ය.<br><br>(4) කල්බදු මූල්‍යාකරණයක සඳහන් උපකරණයක්, එය භාර දීම සඳහා නියමිත කාලසීමාව ඇතුළත භාර දී නොමැති බව හෝ ඒ කාලයෙන් පසුව භාර දී ඇති බව හෝ ඒ උපකරණයට අදාළ සැපයුම් ගිවිසුමේ ඇති නියම, කොන්දේසි, ප්‍රතිඥාභාර හෝ පිරිවිතරවලට අනුකූල නොවන බව හෝ නොතකා, බදු ගැනුම්කරුවකු විසින් ඒ උපකරණය භාරගනු ලැබ ඇති අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඉන් පසුව, (1) වන උපවගන්තිය යටතේ උපකරණය ප්‍රතික්ෂේප කිරීමේ හෝ බද්ද අවසන් කිරීමේ හෝ අයිතිය බදු ගැනුම්කරුට නොමැත්තේ ය. | |

| | | |
|---|---|---|
| | (5) මේ වගන්තියේ විධිවිධාන සලස්වනු ලැබ ඇති පරිදි හැර, සැපයුම්කරුවකු විසින් උපකරණයක් භාර නොදීමේ හෝ ප්‍රමාද වී භාරදීමේ හෝ සැපයුම් ගිවිසුමේ ඇතුළත් නියම, කොන්දේසි, ප්‍රතිඥාභාර හෝ පිරිවිතරවලට ඒ උපකරණය අනුකූල නොවීමේ හෝ හේතුව නිසා බදු දීමනාකරු විසින් බදු ගැනුම්කරු වෙත යම් වගකීමක් දැරීම, ඒ භාර නොදීම, ප්‍රමාද වී භාරදීම, හෝ අනුකූල නොවීම බදු දීමනාකරුගේ ක්‍රියාවක් හෝ නොකර හැරීමක් නිසා සිදු වී ඇත්නම් මිස, දරනු නො ලැබිය යුතු ය. | |
| 13අ | *නව විධිවිධානය* | බදු ගැනුම්කරු විසින් උපකරණය කල්බදු ගිවිසුමේ අවශ්‍යතාවන් සමඟ අනුකූල වන බව දක්වමින් හෝ එවැනි අවශ්‍යතාවන් සමඟ ඕනෑම අනුකූල නොවීමක් නොසලකා හැර මෙම උපකරණය බදු ගැනුම්කරු විසින් පිළිගන්නා බවට ලිඛිත ප්‍රකාශයක් බදු දීමනාකරු වෙත ලබා දී ඇත්නම්, කල්බදු මූල්‍යකරණයක් යටතේ බදු ගැනුම්කරුවෙකු උපකරණයක් පිළිගෙන ඇතැයි සැලකෙයි. |
| 14 | කල්බදු මූල්‍යකරණයක් යටතේ සපයන ලද උපකරණය බදු ගැනුම්කරුවකු විසින් භාරගනු ලබන අවස්ථාවක, කල්බද්දේ නියම හා කොන්දේසි ඉන් පසුව වෙනස් කරනු නොලැබිය හැකි අතර, කල්බද්ද යටතේ වන ගෙවීම්වලට අදාළ නියම හා කොන්දේසි ද ඇතුළු ඒ සියලු නියම හා කොන්දේසි පිළිපැදීම බදු ගැනුම්කරුගේ කාර්යය වන්නේ ය. | *අහෝසි කර ප්‍රතිස්ථාපනය කෙරේ.*<br><br>(1) බදු ගැනුම්කරුවෙකුට උපකරණය පරීක්ෂා කිරීම සඳහා සාධාරණාත්මක අවස්ථාවක් ලබා දිය යුතුය.<br><br>(2) බදු ගැනුම්කරුවෙකු උපකරණය පිළිගෙන ඇති අවස්ථාවක දී, කල්බදු මූල්‍යකරණයේ නියමයන් සහ කොන්දේසි කල්බදු මූල්‍යකරණයේ පාර්ශ්වයන්ගේ ප්‍රකාශිත එකඟතාවය මත පමණක් සංශෝධනය කළ යුතු අතර, කල්බදු මූල්‍යකරණය යටතේ වන ගෙවීම්වලට අදාළ නියමයන් සහ කොන්දේසි ඇතුළුව, කල්බදු මූල්‍යකරණයෙහි සියලුම නියමයන් සහ කොන්දේසිවලට අනුකූලව ක්‍රියා කිරීම කල්බදු මූල්‍යකරණයෙහි පාර්ශ්වයන්ගේ යුතුකම වන්නේ ය.<br><br>(3) කල්බදු කාල සීමාව තුළ දී බදු දීමනාකරුට උපකරණය මත ස්වකීය හිමිකාරීත්ව මුද්‍රාව, හැඳුනුම් සංකේතය හෝ වෙනයම් හැඳුනුමක් ඇමිණීමේ අයිතිය සතු වන්නේ ය. |
| 15 | කල්බදු මූල්‍යකරණයක කාලපරිච්ඡේදය ඉකුත් වීම හේතු කොට ගෙන හෝ මේ පනත යටතේ එහි කලින් අවසන් වීම හේතුකොට ගෙන, බදු | *අහෝසි කර ප්‍රතිස්ථාපනය කෙරේ.* |

| | | |
|---|---|---|
| | ගැනුම්කරු විසින් බඳු දීමනාකරු වෙත උපකරණය ආපසු භාරදීම, එය මිලට ගැනීමේ හෝ වැඩි දුර කාලපරිච්ඡේදයක් රඳවා තබා ගැනීමේ හෝ අයිතියක් බඳුකරු විසින් අත්කර ගනු ලැබ ඇත්නම් මිස, 12 වන වගන්තියේ (ඇ) ඡේදය සඳහන් ඒ තත්වයට අනුව කරනු ලැබිය යුතු ය. උපකරණය ආපසු භාරදීමට බඳු ගැනුම්කරු අපොහොසත් වන අවස්ථාවක, එහි සන්තකය ආපසු ලබා ගැනීමේ අයිතියක් බඳු දීමනාකරුට ඇත්තේ ය. | (1) මෙම පනත යටතේ කල්බදු මූල්‍යකරණයක කාලය ඉකුත් වීම මත හෝ කලින් අවසන් වීම මත, බඳු ගැනුම්කරු, මෙම පනතේ 19අ වන වගන්තිය යටතේ මිල දී ගැනීමකට අයිතිය ලබා ගෙන ඇත්නම් හෝ එය තවදුරටත් කාලයක් සඳහා රඳවා ගැනීමට කල්බදු මූල්‍යකරණය යටතේ අයිතියක් ලබා ගෙන ඇත්නම් හැර, 12 වන වගන්තියේ (ඇ) ඡේදය තුළ දක්වා ඇති තත්ත්වයෙන් බඳු දීමනාකරු වෙත උපකරණය ආපසු ලබා දිය යුතු වන්නේ ය.<br><br>(2) මෙම පනත යටතේ කල්බදු මූල්‍යකරණයක කාලය ඉකුත් වීම මත හෝ කලින් අවසන් වීම මත, එම උපකරණය තිබෙන ස්ථානය පිළිබඳව බඳු ගැනුම්කරු විසින් දැනුම් දෙනු ලැබීමට සහ එම උපකරණයේ සන්තකය ආපසු ලබා ගැනීමේ අයිතිය බඳු දීමනාකරු සතු වන්නේ ය. |
| 16 | ((1) බඳු දීමනාකරුගේ කැමැත්ත නොමැතිව බඳු ගැනුම්කරුවකු විසින් සැපයුම් ගිවිසුමක් අවසන් කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු නොලැබිය යුතු ය.<br><br>(2) සැපයුම් ගිවිසුමකට අදාළව මේ පනත යටතේ බඳු ගැනුම්කරුවකු වෙත පැවරුණු අයිතිවාසිකම් කෙරෙහි යම් වෙනස් කිරීමකට බඳු ගැනුම්කරු විසින් ලියවිල්ලකින් කැමැත්ත දී ඇත්නම් මිස, ඒ ගිවිසුමේ නියමයක්, කොන්දේසියක්, ප්‍රතිඥාභාරයක් හෝ පිරිවිතරයක් පිළිබඳ යම් වෙනස් කිරීමක්, බලනොපෑ යුතු ය. | *වෙනසක් නොමැත* |
| 17 | (1) කල්බදු මූල්‍යකරණයක් යටතේ උපකරණයක් ප්‍රතිඥාභාර සහ පිරිවිතරවලට බඳුගැනුම්කරු ලියවිල්ලකින් එකඟ වන තුරු, නොකළ යුතු ය.<br><br>(2) (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව බඳු දීමනාකරුවකු සැපයුම් ගිවිසුමකට ඇතුළත් වීමෙන් අනතුරුව ගිවිසුමේ සඳහන් උපකරණය ඒ ගිවිසුම යටතේ නියමිත වේලාවට හෝ ඊට පෙර භාරදුන් අවස්ථාවක, ගිවිසුමේ සඳහන් නියම, කොන්දේසි, ප්‍රතිඥාභාර හා පිරවිතරවලට උපකරණය අනුකූලවන්නේ නම්, සපයන ලද උපකරණය බඳු ගැනුම්කරු විසින් භාරගනු ලැබිය යුතු ය. | *17(1) වන වගන්තිය අහෝසි කර, 17(2) වන වගන්තිය, 17(1) වන වගන්තිය ලෙස නැවත අංකනය කළ යුතුය.* |

| | | |
|---|---|---|
| 17අ | *නව විධිවිධානය* | සැපයුම් ගිවිසුම ලිඛිතව පැවතිය යුතු අතර, එහි පිටපතක් බදු ගැනුම්කරු වෙත අවම වශයෙන් බදු ගැනුම්කරුගේ අභිමත භාෂාවකින් සැපයිය යුතු වේ. |
| 17ආ | *නව විධිවිධානය* | සැපයුම් ගිවිසුමට අවම වශයෙන් පහත දක්වා ඇති තොරතුරු ඇතුළත් විය යුතුය;<br><br>(අ) උපකරණය හඳුනා ගැනීමට ප්‍රමාණවත් එහි නිශ්චිත විස්තරයක්;<br><br>(ආ) මිල;<br><br>(ඇ) භාර දෙන ස්ථානය, ආකාරය සහ වේලාව;<br><br>(ඈ) බදු දීමනාකරු, බදු ගැනුම්කරු, සහ සැපයුම්කරුගේ විස්තර;<br><br>(ඉ) බදු දීමනාකරු සහ බදු ගැනුම්කරු අතර කල්බදු මූල්‍යකරණ ගිවිසුමකට පිවිසීමේ අරමුණ සඳහා අදාළ උපකරණය ලබා ගෙන ඇති බවට වන ප්‍රකාශයක්; සහ<br><br>(ඊ) සැපයුම් ගිවිසුම් තුළ ඇතුළත් කිරීමට මණ්ඩලය විසින් නියම කරන ලද වෙනත් ඕනෑම කාරණයක්. |
| 17ඇ | *නව විධිවිධානය* | කල්බදු මූල්‍යකරණ ගිවිසුම ලිඛිතව පැවතිය යුතු අතර, ඊට අදාළ පාර්ශ්වයන් විසින් අත්සන් කළ යුතුය. එමෙන්ම, එම ගිවිසුමේ පිටපතක් බදු ගැනුම්කරු වෙත, බදු ගැනුම්කරුගේ අභිමත භාෂාවකින් සැපයිය යුතු වේ. |
| 17ඈ | *නව විධිවිධානය* | කල්බදු මූල්‍යකරණ ගිවිසුමට අවම වශයෙන් පහත දක්වා ඇති තොරතුරු ඇතුළත් විය යුතුය;<br><br>(අ) මෙම ගිවිසුම මෙම පනතේ අරමුණ සඳහා කල්බදු මූල්‍යකරණ ගිවිසුමක් වන බව දැක්වීම;<br><br>(ආ) උපකරණය හඳුනා ගැනීමට ප්‍රමාණවත් වන විස්තරයක්;<br><br>(ඇ) කල්බදු මූල්‍යකරණයෙහි කාල සීමාව; |

| | | |
|---|---|---|
| | | (ඇ) උපකරණයේ අත්කර ගැනීමේ අගය හෝ සාධාරණ අගය;<br><br>(ඉ) කල්බදු මූල්‍යකරණය සම්බන්ධව බදු දීමනාකරු විසින් දරන ලද මූලික පිරිවැයන්;<br><br>(ඊ) ප්‍රමාද ගෙවීම් මත අය කිරීම්;<br><br>(උ) කල්බදු මූල්‍යකරණය යටතේ අය කළ හැකි අනෙකුත් ගාස්තු;<br><br>(ඌ) මෙම කල්බද්ද යටතේ බදු ගැනුම්කරු විසින් ගෙවිය යුතු කල්බදු වාරිකවල මුළු අගය;<br><br>(එ) ගෙවිය යුතු වාරික ගණන සහ ගෙවීම් කළ යුතු කාලය;<br><br>(ඒ) ගෙවිය යුතු වාරිකයේ අගය;<br><br>(ඓ) උපකරණයේ හිමිකාරීත්ව අයිතිය පැවරීමේ ආකාරය සහ නියමයන්;<br><br>(ඔ) ගිවිසුම දීර්ඝ කිරීමේ ආකාරය සහ නියමයන්;<br><br>(ඕ) අදාළ ගිණුම්කරණ ප්‍රමිතිය හෝ ප්‍රමිති යටතේ කල්බදු ගෙවීම තුළ කල්බදු ගෙවීමට ඇතුළත් වන වාර්ෂික පොලී අනුපාතිකය;<br><br>(ඖ) කල්බද්ද සෑහෙන පැහැර හැරීමකට ලක් වී ඇති බවට සැලකිය හැකි තත්වයන්;<br><br>(ඍ) බදු ගැනුම්කරු විසින් කල්බදු ගිවිසුම කලින් අවසන් කිරීමට අදාළව නියමයන් සහ කොන්දේසි;<br><br>(ඎ) උපකරණය යළි සන්තක කර ගැනීමට අදාළව නියමයන් සහ කොන්දේසි; සහ<br><br>(අං) ගිවිසුම තුළ ඇතුළත් කළ යුතු වන, මණ්ඩලය විසින් නියම කරන ලද වෙනත් ඕනෑම කරුණක් |

| | | |
|---|---|---|
| 18 | (1) බදු ගැනුම්කරුවකු වෙත උපකරණයක් සැපයීම සඳහා බදු දීමනාකරුවකු සැපයුම් ගිවිසුමකට ඇතුළත් වන අවස්ථාවක, බදු ගැනුම්කරු ඒ ගිවිසුමේ පාර්ශ්වකරුවකු මෙන් සලකා එකී ගිවිසුම බලාත්මක කිරීමේ අයිතිය බදු ගැනුම්කරුවකුට ද ඇත්තේ ය.<br><br>(2) සැපයුම්කරුවකු විසින් සැපයුම් ගිවිසුමක් යටතේ බැඳීම්, බදු දීමනාකරු හෝ බදු ගැනුම්කරු වෙත ඉටු කරනු ලබන අවස්ථාවක, සැපයුම්කරු අනෙක් තැනැත්තාට ඇති බැඳීමෙන් නිදහස් කරනු ලැබිය යුතු අතර, එබඳු අවස්ථාවක දී, ඒ ගිවිසුම යටතේ එම කාර්යයම හෝ දෙය සම්බන්ධයෙන් බදු දීමනාකරු හා බදු ගැනුම්කරු යන දෙදෙනා විෂයයෙහි සැපයුම්කරු වෙත බැඳීම් පනවා ඇති ලෙස (1) වන උපවගන්තියේ ඇතුළත් විධිවිධාන තේරුම්ගනු නොලැබිය යුතු ය. | *වෙනසක් නොමැත* |
| 19 | (1) උපකරණ තෝරා ගැනීමේ දී බදු දීමනාකරුගේ නිපුණත්වය හා තීරණය මත බදු ගැනුම්කරු තැබූ විශ්වාසය නිසා හෝ උපකරණයේ සැපයුම්කරු තෝරා ගැනීමේ දී බදු දීමනාකරුගේ මැදිහත්වීම නිසා හෝ උද්ගතවන පාඩුවේ ප්‍රමාණයට හැර, කල්බදු මූල්‍යකරණයක් යටතේ සපයන ලද උපකරණය සම්බන්ධයෙන් බදු ගැනුම්කරුට සිදු වූ යම් පාඩුවක් වෙනුවෙන් බදු දීමනාකරුවකු කිසිම වගකීමක් නොදැරිය යුතු ය.<br><br>(2) (1) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, කල්බදු මූල්‍යකරණයක් යටතේ සපයන ලද යම් උපකරණයක් මගින් හෝ එහි භාවිතය නිසා සිදු වූ මරණයක්, පෞද්ගලික පීඩාවක් හෝ දේපළ හානියක් හේතුකොට ගෙන ඇති වන යම් පාඩුවක් සම්බන්ධයෙන් බදු දීමනාකරුවකු බදු දීමනාකරුවකුගේ තත්ත්වයෙන් යම් තැනැත්තකු කෙරෙහි වගකීමකට නොබැඳෙන්නේ ය.<br><br>(3) (2) වන උපවගන්තියෙහි සඳහන් පාඩුවක් සම්බන්ධයෙන්, බදු දීමනාකරුවකු නොවන තත්වයකින් ඇතිවන වගකීම් කෙරෙහි එම උපවගන්තියේ විධිවිධාන බල නොපාන්නේ ය. | *වෙනසක් නොමැත* |
| 19අ | *නව විධිවිධානය* | කල්බදු කාල සීමාව අවසානයේ දී, කල්බදු මූල්‍යකරණය යටතේ බදු ගැනුම්කරු විසින් බදු දීමනාකරු වෙත සියලු හිඟ මුදල් පියවනු ලැබීමට යටත්ව, බදු ගැනුම්කරු හට කල්බදු උපකරණයේ හිමිකාරීත්වය සඳහා අයිතියක් ලැබිය යුතු අතර, එවැනි අයිතියක් බදු ගැනුම්කරු විසින් අත්සන් |

| | | |
|---|---|---|
| | | කරන ලද වෙනත් ඕනෑම කල්බදු ගිවිසුමක් හෝ ඇප බැඳුම්කරයක් ඇතුළුව, බදු දීමනාකරු හෝ වෙනත් ඕනෑම පුද්ගලයකු විසින් බදු ගැනුම්කරු සමඟ එකඟ වී ඇති වෙනත් ඕනෑම ගිවිසුමක බලාත්මක වීමක් හේතුවෙන් බදු දීමනාකරු විසින් රඳවා තබා නොගත යුතු වේ. |
| 20 | කල්බදු මූල්‍යකරණයේ ඇතැම් නියම හා කොන්දේසිවලට අනුකූලව කටයුතු නොකිරීමෙන් ඒ කල්බද්ද පිළිබඳ සැහෙන පැහැර හැරීමක් ලෙස සැලකිය හැකි පැහැර හැරීමක් බදු ගැනුම්කරුවකු විසින් කරනු ලැබ ඇති අවස්ථාවක, 21 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, බදු දීමනාකරු විසින් —<br><br>(අ) කල්බද්දේ එසේ ගෙවීම සඳහා විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, කල්බද්ද යටතේ අයවිය යුතු මුදල් කඩිනමින් ගෙවන ලෙස බදු ගැනුම්කරුට නියම කිරීම; හෝ<br><br>(ආ) (අ) ඡේදය යටතේ නියමිත පරිදි කඩිනම් ගෙවීම් කිරීමට, බදු ගැනුම්කරු අපොහොසත්වන අවස්ථාවක, කල්බදු මූල්‍යකරණය අවසන් කරනු ලැබිය හැකි අතර,<br><br>(i) සපයන ලද උපකරණයේ සන්තකය ආපසු ලබා ගැනීම; සහ<br><br>(ii) කල්බදු මූල්‍යකරණයේ නියම හා කොන්දේසිවලට අනුකූලව බදු ගැනුම්කරු එහි විධිවිධාන අනුව කටයුතු කර ඇත්නම්, බදු දීමනාකරු විසින් දරනු ලැබිය හැකිව තිබුණු තත්වයකට, බදු දීමනාකරු පත් කිරීමට අවශ්‍ය අලාභ අයකර ගනු ලැබිය හැකි ය. | *අහෝසි කර ප්‍රතිස්ථාපනය කෙරේ.*<br><br>(1) අදාළ කල්බදු මූල්‍යකරණ ගිවිසුමට අනුකූලව සැහෙන පැහැර හැරීමකට හේතු වන ආකාරයෙන්, කල්බදු මූල්‍යකරණයේ නියමයන් සහ කොන්දේසි සමඟ, බදු ගැනුම්කරු අනුකූල වීමට අපොහොසත් වන අවස්ථාවක දී, බදු ගැනුම්කරු විසින් බදු දීමනාකරු වෙත ඒ සම්බන්ධව ලියාපදිංචි තැපෑලෙන්;<br><br>(අ) සැහෙන පැහැර හැරීමකට හේතු වී ඇති තත්ත්වයක් නිශ්චිතව දක්වමින්; සහ<br><br>(ආ) (අ) ඡේදයෙහි දක්වා ඇති පැහැර හැරීම සඳහා පිළියම් යෙදීමට, දැනුම් දුන් දිනෙන් දින 14කට වඩා නොඅඩු , දිනයක් පත් කරමින්;<br><br>දැන්වීමක් කළ යුතු වේ.<br><br>(2) දැන්වීමෙහි පත් කළ දින හෝ ඊට පෙර, (1) වන උප වගන්තිය යටතේ ලබා දුන් දැන්වීමෙහි දක්වා ඇති පැහැර හැරීමට පිළියම් යෙදීමට බදු ගැනුම්කරුවෙකු අපොහොසත් වන අවස්ථාවේ දී, හෝ එවැනි අපොහොසත් වීමක් සඳහා සාධාරණ හේතුවක් ලබා දීමට අපොහොසත් වන්නේ නම්, බදු දීමනාකරු විසින්;<br><br>(අ) දැන්වීමෙන් දින 28කට නොඅඩු කාලයක් තුළ දී, මෙම පනතේ 22(2) වන වගන්තිය යටතේ *අවශ්‍ය වෙනස්කම් සමඟ* බදු ගැනුම්කරු විසින් බදු දීමනාකරු වෙත ගෙවිය යුතු මුදල් කඩිනම් ගෙවීම් කිරීමට නියම කිරීම;<br><br>(ආ) බදු ගැනුම්කරුවෙකු (අ) ඡේදය යටතේ අවශ්‍ය වන පරිදි කඩිනම් ගෙවීම් සිදු කිරීමට අපොහොසත් වන අවස්ථාවක දී, බදු ගැනුම්කරුට කල්බදු මූල්‍යකරණය අවසන් කළ හැකි අතර, බදු ගැනුම්කරු විසින් එවැනි දැන්වීමක් සිදු කළ දිනයේ සිට දින 14ක් නොඉක්මවන කාලය තුළ දී, බදු දීමනාකරු වෙත උපකරණවල සන්තකය භාර දිය යුතු වීම; සහ |

| | | |
|---|---|---|
| | | (ඇ) ඉහත නියම කර ඇති කාලය තුළ බදු ගැනුම්කරු සන්තකය භාර දීමට අපොහොසත් වන අවස්ථාවේ දී, බදු දීමනාකරු විසින්;<br><br>(i) මෙම පනතේ 27 හෝ 28 වගන්ති යටතේ උපකරණවල සන්තකය ආපසු ලබා ගැනීම; සහ<br><br>(ii) පහත 22 වන වගන්තිය (2) යටතේ බදු ගැනුම්කරු වෙත හිඟ මුදල් ආපසු අය කර ගැනීම;<br><br>සිදු කළ හැකිය.<br><br>(3) බදු ගැනුම්කරුවෙකු විසින් (1) උපවගන්තියෙහි දක්වා ඇති පැහැර හැරීමට එහි නියම කර ඇති කාලය තුළ දී පිළියම් යොදන අවස්ථාවක දී, බදු දීමනාකරු කල්බදු මූල්‍යකරණය අඛණ්ඩව පවත්වා ගෙන යා යුතු අතර, බදු ගැනුම්කරු කල්බදු මූල්‍යකරණයෙහි නියමයන් සහ කොන්දේසිවලට අඛණ්ඩව අනුකූල වෙමින් ක්‍රියා කළ යුතුය. |
| 21 | (1) 20 වන වගන්තිය යටතේ කඩිනම් ගෙවීමේ හෝ මුදල් කල්බද්දක් අවසන් කිරීමේ අයිතිය බලාත්මක කිරීමට පෙරාතුව, බදු දීමනාකරු විසින්—<br><br>(අ) කල්බදු මූල්‍යකරණයේ අර්ථානුකූලව කල්බද්ද පිළිබඳ සැහෙන පැහැර හැරීමක් සිදු කිරීමට හේතු වූ අවස්ථානුගත කරුණු සඳහන් කරමින්;<br><br>(ආ) (අ) ඡේදයෙහි සඳහන් පැහැර හැරීමට පිළියම් යෙදීම සඳහා දැන්වීම ලැබීමෙන් පසුව, දින හතකට නොඅඩු දිනයක් නොවන දිනයක් නියම කරමින්,<br><br>බදු ගැනුම්කරු වෙත ලියාපදිංචි තැපෑලෙන් දැන්වීමක් භාර දිය යුතු ය.<br><br>(1) වන උපවගන්තිය යටතේ භාර දෙන ලද දැන්වීමක සඳහන් පැහැර හැරීම සම්බන්ධයෙන් පිළියම් යෙදීමට දැන්වීමෙහි නියමිත දින හෝ ඊට පෙර බදු ගැනුම්කරුවකු අපොහොසත් වන හෝ ඒ පැහැර හැරීම සම්බන්ධයෙන් සාධාරණ හේතුවක් දැක්වීමට අපොහොසත් වන | *අහෝසි කර ප්‍රතිස්ථාපනය කෙරේ.*<br><br>(1)<br><br>(අ) කල්බද්දට දෙන ලද උපකරණය පිරිමැසිය නොහැකි හානියකට ලක් වී ඇත්නම්, හෝ විනාශ වී ඇත්නම් හෝ එලෙස කිරීමට උත්සාහ ගෙන ඇත්නම්;<br><br>(ආ) කල්බද්දට දෙන ලද උපකරණය අධිකරණමය ක්‍රියාවලියක් යටතේ අත්කර ගෙන ඇත්නම් හෝ කැපබලයකට හෝ භාරයකට යටත්ව ඇත්නම්;<br><br>(ඇ) බදු ගැනුම්කරුගේ බුන්වත්භාවය හෝ අවසානය සඳහා අධිකරණයෙහි අයදුම්පතක් ගොනු කර ඇත්නම්; හෝ<br><br>(ඇ) කල්බදු ගිවිසුමෙහි ඕනෑම වැදගත් අංගයකට අදාළව බදු ගැනුම්කරු විසින් සිදු කරන ලද ඕනෑම නියෝජනයක් අසත්‍ය වන්නේ නම්;<br><br>බදු දීමනාකරු විසින් බදු ගැනුම්කරු වෙත මූල්‍යකරණ කල්බද්ද වහාම අවසන් කිරීමේ ලිඛිත නිවේදනයක් යොමු කළ හැකිය. තවද, එවැනි අවසන් |

| | | |
|---|---|---|
| | අවස්ථාවක, බදු දීමනාකරු විසින් 20 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කරනු ලැබිය හැකි ය. | කිරීමකට පසුව, මෙම පනතේ 27 හෝ 28 වන වගන්ති යටතේ, හැකිතාක් ප්‍රායෝගික වන පරිදි, උපකරණය යළි සන්තක කර ගැනීමේ අයිතිය බදු දීමනාකරු සතු විය යුතුය.<br><br>(2) බදු ගැනුම්කරුට මූල්‍යකරණ කල්බද්ද ක්‍රියාත්මක වන කාල සීමාව තුළ ඕනෑම අවස්ථාවක දී;<br><br>(අ) පහත 22(2) වගන්තියේ විධිවිධානවලට යටත්ව, බදු දීමනාකරු වෙත දින 30ක දැන්වීමක් දීමෙන් පසු, මූල්‍යකරණ කල්බද්ද නිමා කොට, එකී දැන්වීමේ කාල සීමාව ඉක්ම යාමට පෙර උපකරණයේ සන්තකය බදු දීමනාකරු වෙත භාර දීම; හෝ<br><br>(ආ) බදු දීමනාකරු වෙත දින 14ක දැන්වීමක් ලබා දීම මගින්, කල්බදු මූල්‍යකරණය අවසන් කර, උපකරණය මිල දී ගැනීම සඳහා බදු දීමනාකරු වෙත අර්පණය කළ හැකි අතර, බදු දීමනාකරු විසින් පහත 22(3) වගන්තියට යටත්ව, බදු ගැනුම්කරු වෙත උපකරණය අලෙවි කිරීම;<br><br>කළ යුතුය. |
| 22 | මේ පනත යටතේ අයකරගනු ලැබිය හැකි වන්දි ආගණනය කල හැකි ආකාරය සම්බන්ධයෙන් කල්බදු මූල්‍යකරණයෙහි විධිවිධාන සලස්වනු ලැබිය හැකි අතර, එසේ ආගණනය කරනු ලැබූ වන්දි 20 වන වගන්තියේ (ආ) ඡේදයේ (ii) අනුඡේදය යටතේ විධිවිධාන සලස්වනු ලැබ ඇති වන්දිවලට වඩා සැලකිය යුතු ලෙස අධික වේ නම් මිස, ඒ විධිවිධානය, බදු දීමනාකරු සහ බදු ගැනුම්කරු අතර බලාත්මක කරනු ලැබිය යුතු ය. | *අහෝසි කර ප්‍රතිස්ථාපනය කෙරේ.*<br><br>(1) 20(2)(ආ), 21(1), 21(2)(අ) හෝ 21(2)(ආ) වගන්ති යටතේ කල්බදු මූල්‍යකරණයක් අවසන් කර ඇති අවස්ථාවක දී, එම අවසන් කිරීම;<br><br>(අ) 20(2)(ආ) වගන්තිය හා සම්බන්ධව - කඩිනම් ගෙවීම සිදු කිරීමට බදු ගැනුම්කරු වෙත ලබා දී ඇති අවසාන දිනය කල් ඉකුත් වීමේ සිට;<br><br>(ආ) 21(1) වන වගන්තිය හා සම්බන්ධව - බදු ගැනුම්කරු වෙත යවන ලද අවසන් කිරීමේ දැන්වීමේ සඳහන් දිනයේ සිට; හෝ<br><br>(ඇ) 21(2)(අ) සහ 21(2)(ආ) වගන්ති සම්බන්ධව - බදු ගැනුම්කරු විසින් දෙන ලද අදාළ දැනුම් දීමේ කාලය කල්ඉකුත් වීමෙන් පසුව සිට;<br><br>බලාත්මක විය යුතුය. |

| | | |
|---|---|---|
| | | එසේ වුව ද, එවැනි අවසන් කිරීමක් කල්බදු ගිවිසුම යටතේ බදු දීමනාකරු වෙත හිඟව පවතින ඕනෑම මුදලක් අයකර ගැනීමට බදු දීමනාකරු සතු අයිතියට බලනොපෑ යුතු අතර, අදාළ පරිදි බදු ගැනුම්කරු විසින් එවැනි ගෙවීම් සම්පූර්ණ කරන තෙක්, බදු දීමනාකරු එම උපකරණයේ හිමිකාරීත්වය බදු ගැනුම්කරුට නොපවරනු ඇත.<br><br>(2) මෙම පනතේ 20 (2) (ආ), 21(1) හෝ 21(2)(අ) යන වගන්ති යටතේ කල්බදු මූල්‍යකරණයක් අවසන් කර ඇති අවස්ථාවේ දී, බදු ගැනුම්කරු විසින් පහත දක්වා ඇති දෑ කල්බදු මූල්‍යකරණයේ අවසන් හා සම්පූර්ණ පියවීම වශයෙන් බදු දීමනාකරු වෙත ගෙවිය යුතුය.<br><br>(අ) කල්බදු මූල්‍යකරණය අවසන් කිරීමේ දිනය තෙක් කල්බදු මූල්‍යකරණය යටතේ බදු දීමනාකරු වෙත පවතින යම් හිඟ මුදල්;<br><br>(ආ) උපකරණයෙහි සන්තකය ආපසු අය කර ගැනීමේ දී වැය වූ පිරිවැයන් ඇත්නම් එම පිරිවැයන්;<br><br>(ඇ) විධානයක් මාර්ගයෙන් කලින් කලට මණ්ඩලය විසින් නියම කරනු ඇති පරිදි, බදු දීමනාකරු වෙත ගෙවිය යුතු අනාගත පොලියෙන් ප්‍රතිශතයක්; සහ<br><br>(ඈ) ඉහත 20අ වන වගන්තියට යටත්ව, උපකරණ වෙත සිදු වූ හානි සඳහා බදු දීමනාකරු වෙත හිඟව පවතින ඕනෑම අගයක්<br><br>(3) මෙම පනතේ 21(2)(ආ) වන වගන්තිය යටතේ කල්බදු මූල්‍යකරණයක් අවසන් කර ඇති අවස්ථාවේ දී, බදු ගැනුම්කරු විසින් පහත දක්වා ඇති දෑ කල්බදු මූල්‍යකරණයේ අවසන් හා සම්පූර්ණ ගෙවීම වශයෙන් බදු දීමනාකරු වෙත ගෙවිය යුතුය.<br><br>(අ) කල්බදු මූල්‍යකරණය අවසන් කිරීමේ දිනය හෝ කල්බදු මූල්‍යකරණය යටතේ බදු දීමනාකරු වෙත පවතින යම් හිඟ මුදල්;<br><br>(ආ) කල්බදු මූල්‍යකරණ ගිවිසුමේ දක්වා ඇති ගම්‍ය පොලී අනුපාතයට වට්ටම් කරන ලද කල්බදු මූල්‍යකරණය යටතේ ගෙවිය යුතු කල්බදු වාරිකවල ඉතිරිව පවතින මුළු වර්තමාන අගය; සහ |

| | | |
|---|---|---|
| | | (ඇ) විධානයක් මාර්ගයෙන් කලින් කලට මණ්ඩලය විසින් නියම කරනු ඇති පරිදි, කල්බදු මූල්‍යකරණය යටතේ ගෙවිය යුතු ඉතිරිව පවතින මුළු කල්බදු වාරිකවලින් ප්‍රතිශතයක්.<br><br>(4) කල්බදු මූල්‍යකරණයක් අවසන් කිරීම සම්බන්ධව, 22(2) සහ 22(3) වගන්තිවල සඳහන් අගයන් හැර, කල්බදු මූල්‍යකරණයක් මගින් බදු ගැනුම්කරුගෙන් ගෙවිය යුතු යැයි උපචිත හෝ අය විය යුතු යැයි කිසිදු අගයක් සඳහා විධිවිධාන නොසැලැස්විය යුතුය. |
| 23 | අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගැනීමෙන් නිසි උද්යෝගයකින් ක්‍රියා කිරීම නිසා බදු දීමනාකරුට වළක්වාගත හැකිව තිබුණු යම්තාක් අලාභ, 20 වන වගන්තියේ (ආ) ඡේදයේ (ii) වන අනුඡේදය යටතේ අයකර ගැනීමට බදු දීමනාකරුට හිමිකම නොතිබිය යුතු ය. | *අහෝසි කෙරේ* |
| 24 | (1) කල්බදු මුල්‍යකරණයකට එළඹෙන අවස්ථාවක දී හෝ ඉන් පසුව ලබාගත් බදු දීමනාකරුගේ ලිඛිත කැමැත්ත ඇතිව, කල්බදු මුල්‍යකරණය යටතේ වූ හෝ ඒ කල් බද්ද යටතේ සපයන ලද කිසියම් උපකරණයකට හෝ ඒ දෙයාකාරයටම අදාළ වු බදු දීමනාකරුගේ අයිතිවාසිකම් සියල්ලම හෝ ඉන් කිසිවක් යම් ලියාපදිංචි කරන ලද ආයතනයක් වෙත හෝ යම් විශේෂ කාර්ය ප්‍රවාහකයක් වෙත පැවරීම හෝ භාර කිරීම කරනු ලැබිය හැකිය.<br><br>එසේ වුවද, යම් විශේෂ කාර්ය ප්‍රවාහකයක් වෙත පැවරීමක් හෝ භාර කිරීමක් කරනු ලැබු විටකදී, එම පැවරීම හෝ භාර කිරීම සුරැකඅම්කරණය කිරීමේ කාර්යය සඳහාම පමණක් කරනු ලැබිය යුතු අතර, සුරැකුම්කරණ ව්‍යුහය සඳහා වූ සැලැස්ම මහ බැංකුව විසින් අනුමත කරන ලද පරිදි වූ එකක් විය යුතුය.<br><br>(2) ලියාපදිංචි කරන ලද ආයතනයක් හෝ විශේෂ කාර්ය ප්‍රවාහකයක්, මහ බැංකුව විසින් අනුමත කරන ලද ව්‍යුහයට අනුකූලව සහ මහ බැංකුව විසින් කලින් කලට නිකුත් කරනු ලැබිය හැකි යම් නියෝග සහ මාර්ගෝපදේශවලට අනුකූලව පමණක් සුරැකුම්කරණය ක්‍රියාත්මක කල යුතුය. | *(1) උපවගන්තිය සඳහා අතුරු විධානයෙහි "යුතු අතර, සුරැකුම්කරණ ව්‍යුහය සඳහා වූ සැලැස්ම  මහ බැංකුව විසින් අනුමත කරන ලද පරිදි වූ එකක් විය" යන්න අහෝසි කෙරේ.*<br><br>*(2) උපවගන්තිය අහෝසි කෙරේ.*<br><br>4(අ) උපවගන්තියෙහි "මහ බැංකුව විසින් අනුමත කරන ලද සුරැකුම්කරණ ව්‍යුහය සඳහා වූ සැලැස්ම යටතේ ඒ පැවරීම හෝ භාර කිරීම කර ඇති බවට" යන්න අහෝසි කෙරේ.<br><br>*(5) උපවගන්තිය ලෙස එක් කරන්න:*<br><br>(5) එවැනි ඕනෑම භාර කිරීමක් හෝ සුරැකුම්කරණයක් නොතකමින්, 11(1) වන වගන්තිය යටතේ විධිවිධාන සලස්වා ඇති සාමකාමී භුක්තියක් සඳහා බදු ගැනුම්කරු සතු අයිතිය සහ සියලු හිඟ මුදල් පූර්ණ වශයෙන් ගෙවීම මත උපකරණ මිල දී ගැනීම සඳහා බදු ගැනුම්කරුගේ අයිතියට, භාර කිරීමෙහි හෝ සුරැකුම්කරණයෙහි සියලු පාර්ශ්වයන් විසින් ගරු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | (3) (1) වන උපවගන්තිය යටතේ වූ පැවරුමකින් හෝ භාරකිරීමකින්, පැවරුම්කරු හෝ භාරකරන්නා -<br><br>(අ) කල්බදු මූල්‍යකරණය යටතේ වූ ස්වකීය කාර්යවලින් මුදාහැරීමක් හෝ ඒ කල්බදු මූල්‍යකරණයේ ස්වභාවයේ හෝ නීතියේ බලපෑමේ වෙනස් කිරීමක් ; හෝ<br><br>(ආ) කල්බදු මූල්‍යකරණය යටතේ සපයන ලද කිසියම් උපකරණයකට අදාළ වනතාක් දුරට ස්වකීය කාර්යයවලින් මුදාහැරීමක්,<br><br>නොවන්නේ ය.<br><br>(4) (203 වන අධිකාරය වූ) මොටර් රථවාහන පනතේ අර්ථානුකූලව, මෝටර් රථයක් කෙරෙහි බදු දීමනාකරු සතු අයිතිවාසිකම් (1) වන උපවගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි බදු දීමනාකරු විසින් විශේෂ කාර්ය ප්‍රවාහකයක් වෙත පැවරීමකින් හෝ භාරකිරීමකින් පසු<br><br>(අ) (203 වන අධිකාරය වූ) මෝටර් රථවාහන පනතේ එරෙහිව කුමක් සඳහන් වුවද, පැවරුම්ලාභියා හෝ භාරගන්නා මෝටර් රථයේ පරම අයිතිකරු වශයෙන් සලකනු ලැබිය යුතු අතර, අවස්ථාවෝචිත පරිදි පැවරීමකින් හෝ භාරකිරීමකින් පසුව දින හතක් ඇතුළත, පැවරුම්ලාභියා හෝ භාරගන්නා විසින්, කොමසාරිස්වරයා විසින් සලසනු ලැබිය හැකි යම් ආකෘතියකින් තත්කාර්යය සඳහා පවත්වාගෙන යන නිසි රෙජිස්ටරයක, වාහනයේ පරම අයිතිකරු ලෙස පැවරුම්ලාභියාගේ හෝ භාරගන්නාගේ නම් ඇතුළත් කරනු ලැබීම සඳහා කොමසාරිස්වරයා වෙත ඉල්ලුම් කරනු ලැබය හැකිය. ඉල්ලුම්පත්‍රය සමඟ ඉහත කී පනත යටතේ ඒ සඳහා නියමිත ගාස්තුව සහ අවස්ථාවෝචිත පරිදි, පැවරීමේ හෝ භාර කිරීමේ සාධන පත්‍රයෙහි පිටපතක් ද ඉදිරිපත් කල යුතුය. මහ බැංකුව විසින් අනුමත කරන ලද සුරැකුම්කරණ ව්‍යුහය සඳහා වූ සැලැස්ම යටතේ ඒ පැවරීම හෝ භාරකිරීම කර ඇති බවට ඉල්ලුම්පත්‍රය සමඟ කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කරන ලද ලේඛනවල වූ අන්තර්ගත කරුණු මත කොමසාරිස්වරයා විසින් සෑහීමට පත්වීමෙන් පසුව, කොමසාරිස්වරයා විසින් පවත්වාගෙන යනු ලබන නිසි රෙජිස්ටරයක, වාහනයේ පරම | |

| | | |
|---|---|---|
| | අයිතිකරුවන් ලෙසින් අවස්ථාවෝචිත පරිදි, පැවරුම්ලාභියාගේ හෝ භාරගන්නාගේ නම් ඇතුළත් කරනු ලැබීමට සලස්වනු ලැබිය යුතුය; සහ<br><br>(ආ) ඉහත කී පනත යටතේ හෝ කල්බදු මූල්‍යකරණය යටතේ, (1) වන උපවගන්තිය යටතේ ස්වකීය අයිතිවාසිකම් පැවරීමට හෝ භාර කිරීමට පෙරාතුව ම පැවරුම්කරු හෝ භාරකරු විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකිව තිබුණා වූ සියලු අයිතිවාසිකම්, ලියාපදිංචි කරන ලද දින සිට පැවරුම්ලාභියා හෝ භාරගන්නා විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකිය.<br><br>මේ වගන්තියේ කාර්යය සඳහා, "කොමසාරිස්වරයා" යන්නෙන් (203 වන අධිකාරය වූ) මෝටර් රථවාහන පනතේ 204 වන වගන්තිය යටතේ පත් කරන ලද මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා අදහස් කෙරේ. | |
| 25 | (1) බදු දීමනාකරුගේ ලිඛිත අවසරය ඇතිව හැර සහ තෙවන පාර්ශ්වකරුවන්ගේ අයිතිවාසිකම් කිසිවකට යටත්ව, කල්බදු මූල්‍යකරණයක් යටතේ වූ උපකරණයක සන්තකයේ හා භාවිතයේ අයිතිවාසිකම බදුගැනුම්කරුවකු විසින් වෙනත් යම් තැනැත්තකු වෙත පවරනු නොලැබිය යුතු ය.<br><br>(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා "තෙවන පාර්ශ්වය" යන්නෙන්, උපකරණයට අදාළ කල්බදු මූල්‍යකරණයක පාර්ශ්වකරුවකු නොවන තැනැත්තකු අදහස් වේ. | *අහෝසි කර ප්‍රතිස්ථාපනය කෙරේ.*<br><br>(1) බදු ගැනුම්කරුවකුට, බදු දීමනාකරුගේ ලිඛිත කැමැත්ත සහිතව, තෙවන පාර්ශ්වයන්ගේ ඕනෑම අයිතිවාසිකමකට යටත්ව, කල් බද්දට දෙන ලද උපකරණයේ සන්තකය සහ භාවිතය සඳහා අයිතිය වෙනත් ඕනෑම පුද්ගලයෙකුට භාර කිරීම හෝ පැවරීම සිදු කළ හැකි ය.<br><br>එසේ වුව ද, බදු ගැනුම්කරු විසින් කල් බද්දට දෙන ලද උපකරණයේ සන්තකය සහ භාවිතය සඳහා අයිතිය එලෙස භාර කිරීමේ හෝ පැවරීමේ අවස්ථාවක දී, එම බදු ගැනුම්කරු කල්බදු මූල්‍යකරණ ගිවිසුම මගින් අඛණ්ඩව බැඳී පවතී.<br><br>(2) බදු ගැනුම්කරුවකුට බදු දීමනාකරුගේ ලිඛිත අවසරය සහිතව සහ එවැනි පැවරුමක් සිදු කරන දිනය තෙක් කල්බදු මූල්‍යකරණය යටතේ කල්බද්දෙහි ඕනෑම හිමිකමක් කීම සඳහා බදුදීමනාකරුගේ ඕනෑම අයිතියකට යටත්ව, වෙනත් ඕනෑම පුද්ගලයෙකු වෙත කල්බදු මූල්‍යකරණයක් යටතේ අයිතිවාසිකම් සහ වගකීම් පැවරිය හැකි ය.<br><br>(3) (1) උපවගන්තියේ අරමුණු සඳහා, තෙවන පාර්ශ්වයක් යන්නෙන් උපකරණයට අදාළව කල්බදු මූල්‍යකරණයක් වෙත පාර්ශ්වයක් නොවන පුද්ගලයෙකු යන්න අදහස් වේ. |

| | | |
|---|---|---|
| 26 | (1) මේ පනත යටතේ බදුදීමනාකරුවකුගේ අයිතිවාසිකම් බදු ගැනුම්කරුවකුගේ බුන්වත්වීමක දී එහි භාරකරුට එරෙහිව හෝ, ඒ උපකරණය තහනමට අල්ලා ගත් යම් ණයහිමියකු ඇතුළුව බදුගැනුම්කරුවකුගේ යම් ණයහිමියකුට ද එරෙහිව බලාත්මක කරනු ලැබිය හැකි ය.<br><br>(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා "බුන්වත් වීමේ දී භාරකරුවකු" යන්නට, බදුගැනුම්කරුවකුගේ ණයහිමියන්ගේ ප්‍රයෝජනය සඳහා බදු ගැනුම්කරුවකුගේ බූදලය පරිපාලනය කරනු පිණිස පත් කරන ලද ඇවරකරුවකු, අද්මිනිස්ත්‍රාසිකරුවකු හෝ වෙනත් තැනැත්තකු ඇතුළත් වේ. | *වෙනසක් නොමැත* |
| 27 | මේ පනත යටතේ හෝ කල්බදු මූල්‍යකරණයක විධිවිධානයක් යටතේ, උපකරණයක සන්තකය ලබා ගැනීමට හිමිකම් ලබන්නා වූ බදු දීමනාකරුවකු විසින්—<br><br>(අ) උපකරණය ඇත්තා වූ ප්‍රදේශය තුළ පිහිටි පොලිස් ස්ථානය භාර නිලධරයා වෙත ඒ අයිතිවාසිකම පිළිබඳව, දැනුම් දෙනු ලැබීම;<br><br>(ආ) ඒ අයිතිවාසිකම ක්‍රියාත්මක කිරීමේ දී සාමය කඩවීමක් වළක්වාලීම සඳහා ඒ පොලිස් ස්ථානයේ පොලිස් නිලධරයකුගේ සහාය ලබා ගැනීම; සහ<br><br>(ඇ) උපකරණයේ සන්තකය, උපකරණයේ සන්තකය ඇති තැනැත්තාගෙන් ප්‍රතිරෝධය පැමක් නොමැතිව ලබා ගැනීමට හෝ යම් විශේෂ තැනැත්තකුගේ සන්තකයේ එය නොමැති අවස්ථාවක, යම් තැනැත්තකුගේ ප්‍රතිරෝධය පැමක් නොමැතිව හෝ එය ලබාගත හැකි නම්, උපකරණය ඇති ස්ථානයේ එහි සන්තකය නැවත ලබා ගැනීම, කළ හැකි ය. | *අහෝසි කර ප්‍රතිස්ථාපනය කෙරේ.*<br><br>(1) මේ පනත යටතේ, උපකරණයක සන්තකය නැවත ලබා ගැනීමට හිමිකම් ලබන්නා වූ බදු දීමනාකරුවකු විසින් එවැනි උපකරණයක සන්තකය ආපසු ලබා ගැනීමට ක්‍රියාමාර්ග ගැනීමට පෙර;<br><br>(අ) උපකරණය හමු වූ ප්‍රදේශය තුළ පොලිස් ස්ථානය භාර නිලධරයා වෙත ඒ අයිතිවාසිකම පිළිබඳව දැනුම් දෙනු ලැබීම;<br><br>(ආ) එකී දැනුම් දීම සමඟ, කල්බදු ගිවිසුම අවසන් කිරීම සහ උපකරණයේ සන්තකය ගැනීම සඳහා බදු දීමනාකරුගේ අයිතිය තහවුරු කෙරෙන සාක්ෂි සපයනු ලැබීම;<br><br>(ඇ) මෙම පනතේ 20(2)(ආ) වන වගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීම ප්‍රකාරව එකී දැන්වීමේ සඳහන් කල සීමාව තුලදී උපකරණයේ සන්තකය භාර දීමට බදු ගැනුම්කරු අපොහොසත් වී ඇති බවට හෝ මෙම පනතේ 21 වන වගන්තිය යටතේ උපකරණයේ අයිතිය ආපසු ලබා ගැනීමට අදාල සිද්ධිමය අවස්ථාවක් හට ගෙන ඇති බවට දිව්රුම් ප්‍රකාශයක් බදු දීමනාකරුගේ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ නිලධාරියකු විසින් පොලිස් ස්ථානය භාර නිලධාරියා වෙත සපයනු ලැබීම; සහ |

| | | |
|---|---|---|
| | | (ඇ) උපකරණයේ සන්තකය ලබා ගැනීම සඳහා අයිතිවාසිකම ක්‍රියාත්මක කිරීමේ දී සාමය කඩවීමක් වළක්වාලීම සඳහා ඒ පොලිස් ස්ථානයේ පොලිස් නිලධරයකුගේ සහාය ලබා ගැනීම;<br><br>සිදු කළ යුතුය.<br><br>(2) පොලිස් නිලධාරියෙකුගේ සහභාගීත්වයෙන් තොරව මෙම වගන්තිය යටතේ උපකරණයක සන්තකය ආපසු ලබා ගැනීම සඳහා කටයුතු නොකළ යුතුය.<br><br>(3) බදු ගැනුම්කරුගෙන් උපකරණවල සන්තකය ලබා ගැනීමේ දී, මෙහි 27(1) වන වගන්තිය යටතේ එවැනි සන්තකයක් සඳහා සහාය ලබා දෙන පොලිස් නිලධරයා සාමය කඩවීමක් සිදු නොවන ආකාරයෙන් බදු ගැනුම්කරුගෙන් උපකරණයේ සන්තකය ලබා ගැනීමට සහ එවැනි සන්තකයක්, යළි සන්තක කර ගැනීමේ ස්ථානයේ සිටින බදුදීමනාකරුගේ නිලධරයෙකුට හෝ නියෝජිතයෙකු වෙත භාර දීමට කටයුතු කළ යුතුය.<br><br>(4) සන්තකය ආපසු ලබා ගැනීමේ අයිතිය ක්‍රියාත්මක කිරීමේ දී, බදු දීමනාකරුගේ ඕනෑම නිලධරයෙකු හෝ නියෝජිතයෙකු විසින් බදු ගැනුම්කරුට හෝ උපකරණයෙහි සන්තකය සතු වෙනත් ඕනෑම පුද්ගලයෙකුට බල කිරීමක් හෝ තුවාල සිදු කිරීමක්, තර්ජනය කිරීමක් හෝ බිය වැද්දීමක් සිදු නොකළ යුතුය.<br><br>(5) කල්බදු මූල්‍යකරණයට යටත්ව පවතින උපකරණය පොළොවට හෝ යම් වෙනත් චංචල හෝ නිශ්චල දේපළක් සවි කර තිබීම, හෝ එවැනි ඉවත් කිරීමකට විශේෂ උපකරණයක්, තාක්ෂණික ප්‍රවීණතාවක් හෝ වෙනත් යමක් අවශ්‍ය වීම හේතුවෙන් ප්‍රායෝගිකව අදාළ පරිශ්‍රයෙන් ඉවත් කිරීමට නොහැකි වන අවස්ථාවේ දී, ඉහත 27(1), 27(2), 27(3), සහ 27(4) වගන්තිවලට යටත්ව, බදු දීමනාකරු විසින් බදු ගැනුම්කරු එවැනි උපකරණයක් තවදුරටත් භාවිත කිරීම වැළැක්වීමට කටයුතු කළ හැකි අතර, එවැනි ක්‍රියාමාර්ගයකින් දින හතක් ඇතුළත අදාළ පරිශ්‍රයෙන් එම උපකරණය ඉවත් කිරීමට කටයුතු කළ යුතුය.<br><br>එසේ වුව ද, බදු ගැනුම්කරු විසින් උපකරණය භාවිත කරනු ලැබීම වැළැක්වීම සඳහා බදු දීමනාකරු විසින් ගනු ලබන ඕනෑම ක්‍රියාමාර්ගයක්, |

| | | |
|---|---|---|
| | | කල්බදු මූලාකරණයට යටත් උපකරණය භාවිත කිරීම සම්බන්ධයෙන් හැර, බදු ගැනුම්කරු විසින් අදාළ පරිශ්‍රය භාවිත කරනු ලැබීම වැළැක්වීමක් සිදු නොවිය යුතුය.<br><br>(6) උපකරණයක සන්තකය ආපසු ලබා ගැනීමේ දී, බදු දීමනාකරුවෙකුට එවැනි උපකරණයක් පොළොවෙන් හෝ එය සම්බන්ධ වී තිබෙන වෙනත් යම් නිශ්චල හෝ චංචල දේපළකින් වෙන් කළ හැකි නමුත්, එලෙස සිදු කිරීමේ දී කල්බදු උපකරණය ඉවත් කිරීමට අවශ්‍යයෙන් ම ආනුෂංගික නම් හැර, උපකරණය සම්බන්ධ වී තිබෙන පොළොවට හෝ නිශ්චල හෝ චංචල දේපළ කිසිදු හානියක් සිදු නොකළ යුතුය.<br><br>(7) බදු දීමනාකරුවෙකු විසින් ආපසු ලබා ගන්නා ලද උපකරණයක්, එලෙස ආපසු ලබා ගැනීමෙන් දින 21කින් පසුව පමණක් බැහැර කිරීම හෝ ඒ සම්බන්ධ කටයුතු කිරීමක් සිදු කළ හැකිය.<br><br>(8) පහත දෑ සඳහන් කරමින්, බදු දීමනාකරු විසින් උපකරණය ආපසු ලබා ගැනීමෙන් දින 14කට නොවැඩි කාලයක් තුළ, බදු දීමනාකරු විසින් ආපසු ලබා ගන්නා ලද උපකරණය බදු ගැනුම්කරු වෙත යළි ලබා දෙන මෙන් දිස්ත්‍රික් අධිකරණය වෙත පෙත්සමක් හෝ දිවුරුම් ප්‍රකාශයක් යොමු කිරීම මගින් අයදුම් කිරීමට බදු ගැනුම්කරුට හැකිය;<br><br>(අ) බදු ගිවිසුම යටතේ බදු ගැනුම්කරුගේ බැඳියාවෙහි පූර්ණ කාර්යසාධනය බදු ගැනුම්කරු විසින් බදු දීමනාකරු වෙත ලබා දී තිබීම,<br><br>(ආ) බදු දීමනාකරුට ගිවිසුම අවසන් කර, උපකරණයේ අයිතිය ලබා ගැනීම සඳහා හිමිකම් නොතිබීම; සහ<br><br>(ඇ) කල්බදු මූලාකරණ ගිවිසුම අවසන් කළ දිනයේ සිට එය යථා තත්ත්වයට පත් කිරීමට සහ එවැනි අවසන් කිරීමක් හේතුවෙන් හට ගත් අලාභ සඳහා ඉල්ලීම් කිරීම<br><br>(9) ඉහත 27(8) වන වගන්තිය යටතේ යොමු කළ පෙත්සමක් විභාග කිරීමේ දී, අධිකරණය විසින් සිවිල් නඩු විධාන සංග්‍රහයේ නියම කර ඇති සාරාංශ ක්‍රියාමාර්ගය අනුගමනය කළ යුතුය. |

| | | |
|---|---|---|
| 28 | (1) 27 වන වගන්තිය යටතේ උපකරණයක සන්තකය ආපසු ලබා ගැනීමට බදු දීමනාකරු අපොහොසත් වන අවස්ථාවක හෝ ඒ වගන්තිය යටතේ සන්තකය ආපසු ලබා ගැනීම ප්‍රායෝගික නොවන්නේ යැයි විශ්වාස කිරීමට තරම් බදු හිමියාට සාධාරණ හේතු ඇති අවස්ථාවක, උපකරණයේ සන්තකය පිළිබඳ ආඥාවක් ලබා ගැනීම සඳහා කල්බදු මූල්‍යකරණයට ඇතුළත් වූ අධිකරණ බල ප්‍රදේශය ඇතුළත පිහිටි දිසා අධිකරණය වෙත බදු දීමනාකරු විසින් ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.<br><br>(2) (1) වන උපවගන්තිය යටතේ වූ ඉල්ලීමක් පෙත්සමක හා දිවුරුම් පත්‍රයක මාර්ගයෙන් කළ යුතු අතර, බදු ගැනුම්කරු එහි වගඋත්තරකරු කළ යුතු ය. තව ද පහත දැක්වෙන විස්තර ඒ ඉල්ලීමෙහි ඇතුළත් විය යුතු ය :—<br><br>(අ) කල්බදු මූල්‍යකරණයේ දිනය;<br><br>(ආ) කල්බද්ද යටතේ යම් ගෙවීම් කර ඇත්නම්, ඒ ගෙවීම්; සහ<br><br>(ඇ) බදු ගැනුම්කරු විසින් කරන ලද පැහැර හැරීම සංයුක්ත කරන අවස්ථානුගත කරුණු.<br><br>(3) පෙත්සම, කල්බදු මූල්‍යකරණයේ සහතික කළ පිටපතක් සමඟ එවිය යුතුය.<br><br>(4) පෙත්සම, දිවුරුම් පත්‍රය හා ඊට අමුණා ඇති ලේඛන සලකා බැලීමෙන්, උපකරණයේ සන්තකය ලබා ගැනීමට පෙත්සම්කරුට මුල් බැල්මට හිමිකමක් ඇතැයි දිසා අධිකරණය සෑහීමට පත් වූ විට, එම අධිකරණය විසින් උපකරණයේ සන්තකය පෙත්සම්කරු වෙත භාර දීමට වගඋත්තරකරුට බල කරමින් වූ සන්තකය පිළිබඳ අතුරු ආඥාවක්, කරනු ලැබිය යුතු ය.<br><br>(5) (4) වන උපවගන්තිය යටතේ කරන ලද අතුරු ආඥාවේ පිටපතක් වගඋත්තරකරු වෙත භාර දිය යුතු අතර,- | *අහෝසි කර ප්‍රතිස්ථාපනය කෙරේ.*<br><br>(1) මෙම පනතේ 27 වන වගන්තිය යටතේ උපකරණයක සන්තකය ආපසු ලබා ගැනීමට බදු දීමනාකරු අපොහොසත් වන අවස්ථාවක හෝ 27 වන වගන්තිය යටතේ උපකරණයේ සන්තකය ආපසු ලබා ගැනීමට උත්සාහ නොකරන අවස්ථාවක දී උපකරණයේ සන්තකයේ ආඥාවක් සඳහා,<br><br>(අ) කල්බදු මූල්‍යකරණයට ඇතුළත් වූ ස්ථානය;<br><br>(ආ) වගඋත්තරකරු පදිංචි ස්ථානය; හෝ<br><br>(ඇ) ආපසු ලබා ගැනීමට නියමිත උපකරණය පිහිටා ඇති ස්ථානය;<br><br>අයත් වන අධිකරණ සීමාව තුළ තිබෙන දිසා අධිකරණය වෙත බදු දීමනාකරුට අයදුම්පතක් යොමු කළ හැකිය.<br><br>(2) බදු දීමනාකරු විසින් විශ්වාසය තබා ඇති කල්බදු මූල්‍යකරණ ගිවිසුමෙහි පිටපතක් අමුණා තිබිය යුතු පෙත්සමක් හා දිවුරුම් ප්‍රකාශයක් මගින් එවැනි ඉල්ලීමක් යොමු කළ යුතු අතර, පහත තොරතුරු එහි ඇතුළත් විය යුතුය;<br><br>(අ) කල්බදු මූල්‍යකරණයෙහි දිනය;<br><br>(ආ) කල්බදු මූල්‍යකරණය යටතේ, ගෙවීම් සිදු කර ඇත්නම්, ඒ පිළිබඳ විස්තර; සහ<br><br>(ඇ) බදු දීමනාකරු විසින් ආපසු ලබා ගැනීමේ අයිතිය ස්ථාපිත වන අවස්ථා.<br><br>(3) ඉහත (1) වන උපවගන්තිය යටතේ යොමු කරනු ලබන ඉල්ලීමක දී, බදු දීමනාකරුවෙකු විසින් සන්තක කර ගැනීමේ ආඥාවක් සඳහා ඉල්ලා සිටීමට අමතරව, මෙම පනතේ 20(2)(ආ) වන වගන්තිය යටතේ අවසන් කරන ලද කල්බදු මූල්‍යකරණයක දී හිඟ වූ යම් මුදල් ආපසු ලබා ගැනීම සඳහා ආඥාවක් අයැද සිටිය හැකි අතර, එවැනි අවස්ථාවක, ඔහු විසින් හිඟ මුදල සහ එවැනි කාරණයක නිර්ණය කිරීම සඳහා අවශ්‍ය වනු ඇති එවැනි වෙනත් කරුණු |

| | | |
|---|---|---|
| | (අ) ආඥාව භාර දීමෙන් පසු දින දාහතරක් ඇතුළත, ආඥාව ස්ථිර නොකළ යුත්තේ මන්දැයි ප්‍රමාණවත් හේතු දැක්වීමට වගඋත්තරකරු අපොහොසත් වන අවස්ථාවක, අධිකරණය විසින් ආඥාව ස්ථිර කරනු ලැබිය යුතු ය;<br><br>(ආ) ආඥාව භාර දීමෙන් පසු දින දාහතරක් ඇතුළත, වගඋත්තරකරු විසින් ආඥාව ස්ථිර නොකළ යුත්තේ මන්දැයි ප්‍රමාණවත් හේතු දක්වන අවස්ථාවක, අධිකරණය විසින් අතුරු ආඥාව ඉවතලිය යුතු ය.<br><br>(6) (5) වන උපවගන්තිය යටතේ කරන ලද ස්ථිර ආඥාවක්, චංචල දේපළක් ආපසු ලබා ගැනීම සඳහා වූ තීන්දු ප්‍රකාශයක් මෙන්, ඒ ආකාරයට ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය. | ගොනු කරන ලද පෙත්සමෙහි සහ දිවුරුම් පත්‍රයෙහි නිශ්චිතව දක්වනු ලැබිය යුතුය.<br><br>(4) බදු දීමනාකරු විසින් පෙත්සම ඉදිරිපත් කිරීමේ දී, උපකරණයේ සන්තකයට හිමිකම් පෑම සඳහා පෙත්සම්කරුට නෛතික අයිතියක් සතු බව සහ හිමිකම් පෑ යම් මුදලක් බදු දීමනාකරු වෙත නීත්‍යානුකූලව හිඟ බවට දිව්රුම් ප්‍රකාශයක්, කෙටුම්පත් අතුරු ආඥාවක්, අතුරු ආඥාව සහ එහි සේවය සඳහා අවශ්‍ය වන මුද්දර ගාස්තු, පෙත්සම සමඟ ගොනු කළ යුතුය.<br><br>(5) පෙත්සම්කරුවකු විසින් බදු ගැනුම්කරු මෙම පනත යටතේ ගොනු කරන ලද නීතිමය ක්‍රියාවක වගඋත්තරකරු ලෙස නම් කරනු ලැබිය යුතු අතර, උපකරණයේ සන්තකය සතු වෙනත් ඕනෑම පුද්ගලයෙකු වගඋත්තරකරුවන් ලෙස නම් කරනු ලැබිය හැකිය. එමෙන්ම, නීතිමය ක්‍රියාවෙහි වගඋත්තරකරුවන් ගණනට සමාන වන පරිදි, පැමිණිල්ලෙහි සහ දිවුරුම් පත්‍රයේ පිටපත් ගණනක් අධිකරණයෙහි ගොනු කළ යුතුය.<br><br>(6) 28(4) වන වගන්තිය යටතේ බදු ගැනුම්කරුවකු විසින් යොමු කරනු ලැබීමට නියමිත දිවුරුම් ප්‍රකාශය බදු ගැනුම්කරුගේ යම් අධ්‍යක්ෂවරයෙකු හෝ ප්‍රධාන නිලධරයෙකු විසින් සිදු කරනු ලැබිය යුතු අතර, නීතිමය ක්‍රියාමාර්ගයට හේතු වූ කරුණු පිළිබඳව පෞද්ගලික දැනුමක් එම පුද්ගලයා සතු විය යුතු අතර, එවැනි පුද්ගලයකු එහි ඇතුළත් කරුණු පිළිබඳව ඔහුගේ ස්වකීය පෞද්ගලික දැනුමෙන් දිවුරා සාක්ෂි දෙන බවට ඔහුගේ දිවුරුම් ප්‍රකාශයෙහි දිවුරා ප්‍රකාශ කිරීම හෝ සහතික කරනු ලැබීම කළ යුතු අතර, විනිසුරුවරයාගේ අභිමතය පරිදි එහි විෂය පාත්‍රගත වන කරුණු විභාග කරනු ලැබීමට වග වනු ලැබිය යුතුය. |
| 29 | (1) 28 වන වගන්තිය යටතේ වූ ඉල්ලීමක, බදු දීමනාකරුවකුට සන්තකය පිළිබඳ ආඥාවක් ලබා ගැනීම සඳහා ආයාචනය කිරීමට අතිරේකව, කල්බදු මූල්‍යකරණය යටතේ අය විය යුතු මුදල් කිසිවක් ආපසු ලබා ගැනීමේ ආඥාවක් සඳහා ද ආයාචනය කරනු ලැබිය හැකි අතර, එවැනි අවස්ථාවක දී ගොනු කරන ලද පෙත්සමේ හා දිවුරුම් පත්‍රයේ, අය විය යුතු මුදල හා ඒ කරුණ නිශ්චය කිරීමෙහි ලා අවශ්‍ය විය හැකි වෙනත් යම් කාරණා ද, සඳහන් කරනු ලැබිය යුතු ය. | *අහෝසි කර ප්‍රතිස්ථාපනය කෙරේ.*<br><br>(1) දිස්ත්‍රික් අධිකරණය විසින් පෙත්සම සහ දිවුරුම් ප්‍රකාශය සහ ඒ සමඟ අමුණා ඇති ලියකියවිලි සලකා බැලීමෙන් සහ පෙත්සම්කරුට උපකරණ සන්තකයේ තබා ගැනීමට මූලික වශයෙන් හිමිකම් ඇති බවට සෑහීමකට පත්වන අතර, අධිකරණයට ඉදිරිපත් කරන ලද මූල්‍ය බදු ගිවිසුම නිසි ලෙස සකස් කර ඇති බවට අධිකරණයට පෙනී යන අවස්ථාවක දී, එහි කිසියම් වෙනස් කිරීමක් හෝ මකා දැමීමක් හෝ වෙනත් කරුණක් හේතුවෙන් සැකයට විවෘත නොවිය යුතු අතර, නියෝගයකින් නොපෙළඹවමින්, |

| | | |
|---|---|---|
| | (2) 28 වන වගන්තියේ (4) වන හා (5) වන උපවගන්තිවල විධිවිධාන, මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වූ ආඥාවකට අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ කරනු ලැබිය යුතු අතර, අධිකරණය විසින්, ඒ උපවගන්ති යටතේ කරන ලද අතුරු ආඥාවේ හා ස්ථීර ආඥාවේ ආපසු ලබා ගැනීමට බලාපොරොත්තු වන මුදල් ප්‍රමාණය එසේ ලබා ගැනීම සඳහා වූ ආඥාවක් ද, ඇතුළත් කරනු ලැබිය හැකි ය.<br><br>(3) (2) වන උපවගන්තිය යටතේ කරන ලද ස්ථීර ආඥාවක්, මුදල් ආපසු ලබා ගැනීම සඳහා වූ තීන්දු ප්‍රකාශයක් මෙන්, ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය. | පෙත්සම්කරුට උපකරණවල සන්තකය ලබා දෙන මෙන් බදු දීමනාකරු විසින් ඉල්ලා සිටින ලද වෙනත් සහන සමඟ අධිකරණය සලකා බලන දෑ ලබා දෙන මෙන් එක් වගඋත්තරකරුවෙකුට හෝ වගඋත්තරකරුවන් කිහිපදෙනෙකුට, බලකරමින් නයිසයි නියෝගයක් නිකුත් කළ යුතුය.<br><br>කිසියම් වගඋත්තරකරුවෙකුට හෝ කිහිප දෙනෙකුට සන්තකයේ තබා ගැනීමට බලකරමින් නයිසයි නියෝගය නිකුත් කළ යුතුය.<br><br>(2) බදු දීමනාකරුවෙකු ඉල්ලීම් සිදු කර ඇති අවස්ථාවක, අධිකරණය විසින් උපකරණය යළි සන්තක කර ගැනීමේ නියෝගයකට අමතරව, පෙත්සමෙන් ඉල්ලා ඇති මුදල නොඉක්මවන මුදලක් ගෙවීමේ දිනය දක්වා පොළිය සහ නියෝගය සිදු කරන වේලාවේ දී අධිකරණය විසින් ඉඩ ලබා දෙනු ඇති එවැනි පිරිවැය ගෙවීමට නියෝග කරනු ලැබිය හැකිය.<br><br>(3) මෙම පනතේ හෝ වෙනත් යම් නීතියකට පටහැනි යමක් හැර, අධිකරණය විසින් මූල්‍ය කල්බද්ද අවසන් කරන දිනයේ දී බදු දීමනාකරු වෙත ගෙවිය යුතු මුල් මුදල ලෙස ගණනය කරන ලද මුදලට වඩා වැඩි මුදලක් පොලී ලෙස ලබා නොදිය යුතුය.<br><br>එසේ වුව ද, අධිකරණය විසින් මෙම විධිවිධානයේ දැක්වෙන කිසිවක් මගින් බදු දීමනාකරුවෙකුට නීත්‍යානුකූල පොලිය ලබා දීමෙන් වළක්වන්නේ නැත.<br><br>(4)<br><br>(අ) *නෛසයි ආඥාව* සාමාන්‍යයෙන් වගඋත්තරකරු විසින් බදු දීමනාකරුට ඔහු වෙත අදාළ ක්‍රියාවලිය සිදු කිරීමට ලබාදිය හැකි ලිපිනයට ම ලියාපදිංචි තැපෑලෙන් ලබාදිය යුතු වේ.<br><br>(ආ) වගඋත්තරකරු රාජ්‍ය නිලධාරියෙකු වන විටෙක දී, අධිකරණයට එහි අභිමතය පරිදි, නයිසයි නියෝගය ලියාපදිංචි තැපෑලෙන් වගඋත්තරකරුට යැවීමට අමතරව, නයිසයි නියෝගයේ පිටපතක් අනුපිටපත්ව, ලියාපදිංචි තැපෑලෙන් වගඋත්තරකරු සේවයේ නිරත වී සිටින දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වෙත යොමු කළ යුතු අතර, නයිසයි නියෝගයේ පිටපතක් වගඋත්තරකරුට පෞද්ගලිකව භාර දීමටත්, වගඋත්තරකරු විසින් නයිසයි ඇණවුම ලැබුණු බවට පිළිගැනීමක් හෝ ඒ මත පිටසන් කරන ලද නයිසයි නියෝගයේ සේවා ප්‍රකාශයක් සහ සේවය ක්‍රියාත්මක කරන පුද්ගලයා විසින් |

| | | |
|---|---|---|
| | | අත්සන් කරන ලද සහ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා විසින් ම සේවය බලාත්මක නොකර ඇත්නම් දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පිටසන් කරන ලද නයිසයි නියෝගයේ අනෙක් පිටපත අධිකරණයට වහාම ආපසු ලබා දීමටත් කටයුතු කිරීම එම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ යුතුකම වන්නේ ය.<br><br>(ඇ) වගඋත්තරකරුවෙකු රජයේ නිලධාරියෙකු නොවන සහ තවත් පුද්ගලයෙකුගේ රැකියාවක නිරතව සිටින අවස්ථාවක දී, අධිකරණයට එහි අභිමතය පරිදි, වගඋත්තරකරු වෙත ලියාපදිංචි තැපෑලෙන් නයිසයි නියෝගය යොමු කිරීමට අමතරව, නැවත පවරා ගැනීමේ නියෝගය සහ එහි පිටපතක් වගඋත්තරකරුගේ සේවායෝජකයාට ඔහුගේ සුපුරුදු ව්‍යාපාරික ස්ථානයේ දී හෝ සේවායෝජකයා සමාගමක් හෝ සංස්ථාවක් නම්, ඕනෑම ලේකම්වරයෙකුට, කළමනාකරුවෙකුට හෝ සමාගමේ හෝ සංස්ථාවේ වෙනත් නිලධාරියෙකුට භාර දිය යුතු අතර, වගඋත්තරකරු විසින් එවැනි නැවත පවරා ගැනීමේ නියෝගයක් ලැබුණු බවට පිළිගත් ලදුපතක් සමඟ හෝ නැවත පවරා ගැනීමේ නියෝගයේ සේවා ප්‍රකාශයක් සමඟ එය පිටසන් කර, සේවය ක්‍රියාත්මක කරන පුද්ගලයා විසින් ඒ මත අත්සන් කරන කර, එවැනි සේවා යෝජකයෙකු විසින් ම සේවාව ක්‍රියාත්මක කර නොමැති නම් වගඋත්තරකරුගේ සේවායෝජකයා විසින් අනු අත්සන් කර, නිසි නියෝගයේ පිටපතක් වගඋත්තරකරුට පෞද්ගලිකව භාර දීමට සහ නැවත පවරා ගැනීමේ නියෝගයේ අනෙක් පිටපත වහාම අධිකරණයට ආපසු ලබා දීම, එම සේවායෝජකයාගේ හෝ නිලධාරියාගේ යුතුකම වන්නේ ය.<br><br>(ඈ) නයිසයි නියෝගය ලබා දුන් වහාම ඒ වෙනුවෙන් ඉදිරිපත් කරන අයදුම්පතක් මත අධිකරණයට එහි අභිමතය පරිදි, ලියාපදිංචි තැපෑලෙන් නයිසයි නියෝගය ලබා දීම වෙනුවට, ක්‍රියාවලි නිලධාරියෙකු ඔස්සේ පෞද්ගලිකව වගඋත්තරකරු එම නයිසයි නියෝගය ප්‍රදානම කිරීම හෝ ලබා දීම සිදු කළ හැකිය.<br><br>(ඉ) නිසි උද්යෝගිතාව ක්‍රියාත්මක කිරීම මගින් උප වගන්ති (1) සහ (4) හි සඳහන් සේවය ක්‍රියාත්මක කළ නොහැකි නම්, ක්‍රියාවලි නිලධාරියා වගඋත්තරකරු සාමාන්‍යයෙන් පදිංචිව සිටින නිවසේ පැහැදිලි කොටසකට එම නියෝගය ඇලවිය යුතුය. නැතහොත්, සංස්ථාවක් හෝ සමාගමක් වන්නේ නම්, එවැනි සෑම අවස්ථාවක දී ම යළි සන්තක කර ගැනීමේ නියෝගය වගඋත්තරකරු වෙත නිසි පරිදි ලබා දී ඇති බව සැලකිය යුතුය. |

| | | |
|---|---|---|
| | | (ඊ) වගඋත්තරකරුවෙකුට හෝ ඔහු වෙනුවෙන් පෙනී සිටින වෙනත් ඕනෑම පුද්ගලයෙකුට යළි සන්තක කර ගැනීමේ නියෝගයක් ලබා දීමේ දී, එම වගඋත්තරකරුවන් හෝ එම පුද්ගලයා යන දෙදෙනාගේම අත්සන් හෝ මාපටැඟිලි සලකුණු යළි සන්තක කර ගැනීමේ නියෝගය භාරගනු ලැබීමක දී එහි මුල් පිටපත මත තබා ගැනීම ක්‍රියාවලි නිලධාරියාගේ රාජකාරිය වන්නේ ය.<br><br>(උ) ක්‍රියාවලි නිලධාරියා විසින් යළි සන්තක කිරීමේ නියෝගය ලද පුද්ගලයාගේ අනන්‍යතාවට අදාළව, ඔහු වෙත එම නියෝගය ලබා දුන් ආකාරය, එම පුද්ගලයා, ස්ථානය සහ වෙනත් විස්තර, නියෝගය ලබා දුන් දිනය සහ කාලය සවිස්තරාත්මකව සඳහන් කරමින්, එම නියෝගය ලද පුද්ගලයා ඔහුගේ අත්සන හෝ මාපටැඟිල්ල හෝ අත්සන සහ මාපටැඟිල්ල යන දෙකම තැබුවේද, නැතහොත් මුල් පිටපතෙහි අත්සන හෝ මාපටැඟිල්ල හෝ ඒ දෙකම තැබීම ප්‍රතික්ෂේප කළේ ද යන්න වාර්තාවේ සඳහන් කරමින්, රිසිට්පත නැවත උසාවියට ඉදිරිපත් කළ යුතුය.<br><br>(ඌ) නයිසයි නියෝගයක් ක්‍රියාවලි නිලධාරියෙකු ඔස්සේ පෞද්ගලික ව ලබා දිය යුතු වන්නේ නම්, එවැනි නයිසයි නියෝගයක් එය නිකුත් කරන අධිකරණයෙහි අධිකරණ පාත්‍රතාව තුළ දේශීය සීමාවන්ගෙන් බැහැර ව ශ්‍රී ලංකාවෙහි ඕනෑම ප්‍රදේශයක් තුළ දී ලබා දිය යුතු ය යන්නට යටත් ව ලබා දිය යුතු අතර, එවැනි අධිකරණයක් විසින් එම නයිසයි නියෝගය විත්තිකරු පදිංචි වී සිටිනු ඇතැයි විශ්වාස කරනු ලබන අධිකරණ පාත්‍රතාව තුළ අදාළ අධිකරණය වෙත යොමු කළ යුතු අතර, මෙම පනතේ විධිවිධානවලට අනුකූල ව මෙම නයිසයි නියෝගය නිසි ආකාරයෙන් විත්තිකරු වෙත ලබා දීම මෙහි අවසානයට සඳහන් කළ අධිකරණයෙහි වගකීම වේ.<br><br>(5) 29(4) වගන්තිය යටතේ මෙම නයිසයි නියෝගය ක්‍රියාත්මක කිරීමෙන් දින දහ හතරක් ඇතුළත, වගඋත්තරකරුට අධිකරණය ඉදිරියෙහි පෙනී සිටීම සඳහා නික්ම යෑමට ඉල්ලුම්පතක් ගොනු කළ හැකි අතර, මෙම නයිසයි නියෝගය ස්ථිර නොකළ යුත්තේ ඇයි දැයි යන්න හේතු පෙන්නුම් කළ හැකි ය.<br><br>(6) |

| | | |
|---|---|---|
| | | (අ) මෙම වගන්තිය යටතේ ක්‍රියාත්මක කරන ලද ක්‍රියාමාර්ගයක දී වගඋත්තරකරුවෙක් පෙනී සිටීමට සහ හේතු දැක්වීමට අධිකරණයෙන් අවසර ලබා ගැනීමට හැර, නයිසයි නියෝගයට එරෙහිව පෙනී සිටීම හෝ හේතු දැක්වීම සිදු නොකළ යුතු ය.<br><br>(අ) දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම මගින් හේතුව දැක්වීමට සහ අයදුම්පතක් සඳහා පෙනී සිටීමට අවසර ඉල්ලා වගඋත්තරකරු විසින් අයදුම්පතක් ගොනු කිරීම මත, අධිකරණය විසින් පෙත්සම්කරුගේ හිමිකම් සම්බන්ධයෙන් විශේෂයෙන් කටයුතු කළ යුතු අතර, හිමිකම් පෑම සඳහා වන ආරක්ෂාව කුමක්ද සහ විශ්වාසය තැබිය හැකි කරුණු මොනවාද යන්න පැහැදිලිව සහ සංක්ෂිප්තව ප්‍රකාශ කළ යුතු වේ. එමෙන්ම, වගඋත්තරකරුට ඔහු කෙරෙහි ඇහුම්කන් දීමට අවස්ථාවක් ලබා දීමෙන් පසු, මැදිහත් වීම සඳහා වලංගු හේතුවක් පැහැදිලි නම්, නයිසයි නියෝගයට එරෙහි ව පෙනී සිටීමට සහ හේතුව දැක්වීමට අවසර ලබා දිය යුතුය;<br><br>(i) විත්තිකරු විසින් නයිසයි ආඥාවේ සඳහන් මුදල අධිකරණය වෙත ගෙවීම මත; හෝ<br><br>(ii) විත්තිකරු විසින් එවැනි ආරක්ෂාවක් සපයා දීම මත, උසාවිය විසින් නයිසයි ආඥාව නියත ආඥාවක් බවට පත් කළහොත්, නයිසයි ආඥාවේ සඳහන් මුදල සපුරාලීම සඳහා සාධාරණ සහ ප්‍රමාණවත් ලෙස පෙනී සිටිය හැකිය; හෝ<br><br>(ii) ඔවුන් විසින් *සනාථ කෙරෙන තුරු නිවැරදි යැයි පිළිගන්නා ලද (prima facie)*, තිරසාර වන සහ ආරක්ෂාව, රාමුකරණය සහ ගැටලු වාර්තා කිරීම වැනි කොන්දේසි මත හෝ අධිකරණය විසින් සුදුසු යැයි සලකනු ලබන පරිදි ආරක්ෂාවක් අනාවරණය කරන බවට, ගොනු කරන ලද දිවුරුම් ප්‍රකාශයේ අන්තර්ගතය පිළිබඳව අධිකරණය විසින් සෑහීමකට පත්වනු ලැබීම මත,<br><br>(b) (ආ) .... වගන්තිය යටතේ නියම කර ඇති කාල සීමාව තුළ අයදුම්පතක් ගොනු කිරීමට වගඋත්තරකරු අපොහොසත් වන අවස්ථාවේ දී හෝ එවැනි අයදුම්පතක් ගොනු කර ඇති අවස්ථාවක |

| | | |
|---|---|---|
| | | දී, හේතු දැක්වීම සඳහා වන අයදුම්පත ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත්, අධිකරණය විසින් එම නියෝගය ස්ථිර කළ යුතුය.<br><br>(ඇ) ස්ථිර නියෝගයක්, එය විවිධ අංශවලින් සමන්විත වන්නේ නම්, එය අර්ධ වශයෙන් ක්‍රියාත්මක කර, අර්ධ වශයෙන් නියත බවට පත් කළ හැකිය.<br><br>(7)<br><br>(අ) වගඋත්තරකරු නොපැමිණීමේ පදනම මත ස්ථිර කරන ලද යළි සන්තක කරගැනීමේ නියෝගයට එරෙහිව වගඋත්තරකරුවෙකු විසින් කිසිදු අභියාචනයක් ඉදිරිපත් නොකළ යුතු නමුත්, ස්ථිර නියෝගය ඇතුළත් කිරීමෙන් පසු සාධාරණ කාලයක් තුළ යම්කිසි වගඋත්තරකරුවෙකු විසින් එවැනි ස්ථිර නියෝගයකට එරෙහිව සමාලෝචන ක්‍රියාපටිපාටියක් මගින් ආරම්භ කරන ලද අයදුම්පතක්, හදිසි අනතුරක් හෝ අවාසනාවක් හේතුවෙන් නැවත පවරා ගැනීමේ නියෝගය ලබා දීමෙන් පසු අයදුම්කරුට පෙනී සිටීම වළක්වාලන හෝ එවැනි යළි සන්තක කරගැනීමේ නියෝගයක් ඔහුට ලබා දී නොමැති පසුබිමක් මත, එවැනි අයදුම්පතක් සලකා බැලීමට සුදුසු විය යුතුය<br><br>(ආ) (1) උපවගන්තිය යටතේ අයදුම්පතක් ඉදිරිපත් කරනු ලබන පදනම අධිකරණය සෑහීමකට පත්වන වන පරිදි නිසි ලෙස පිහිටුවා ඇති අවස්ථාවක දී, අයදුම්කරු මත එවැනි නියමයන් සහ කොන්දේසි පැනවීම යුක්තිසහගත සහ නිවැරදි යැයි අධිකරණය විසින් සලකනු ලැබීම මත, අධිකරණයට ස්ථිර නියෝගය ඉවත් කළ හැකි අතර, එලෙස ස්ථිර නියෝගය ඉවත් කිරීමෙන් පසුව, මෙම වගන්තියේ විධිවිධානවලට අනුකූලව මෙම කාරණය විභාග කිරීම සහ තීරණය කිරීම අධිකරණය විසින් සිදු කළ යුතුය.<br><br>(ඇ) මෙම වගන්තියේ (1) උපවගන්තිය යටතේ කිසියම් වගඋත්තරකරුවෙකු විසින් සමාලෝචන ක්‍රියාපටිපාටියක් මගින් අයදුම්පතක් ඉදිරිපත් කරනු ලැබුවහොත්, සමාලෝචන ක්‍රියාපටිපාටිය මගින් එවැනි අයදුම්පතකට අදාළ සිවිල් නඩු විධාන සංග්‍රහයේ (පරිච්ඡේදය 101) විධිවිධාන අදාළ විය යුතුය.<br><br>(ඇ) ඉහත (ආ) යටතේ පෙනී සිටීමට සහ හේතුව දැක්වීමට අධිකරණය වගඋත්තරකරුවෙකුට අවසර දෙන අවස්ථාවේ දී, සිවිල් නඩු විධාන |

සංග්‍රහයේ (101 පරිච්ඡේදය) 384, 385, 386, 387, 390 සහ 391 යන වගන්තිවල විධිවිධාන *අවශ්‍ය සංශෝධන සමඟ* මෙම ක්‍රියාමාර්ගයේ නඩුව සඳහා අදාළ විය යුතුය.

(ඉ) මෙම වගන්තිය යටතේ ක්‍රියාත්මක කරන ලද ක්‍රියාමාර්ගයක් තුළ ඇතුළත් කර ඇති ස්ථිර නියෝගය, සිවිල් නඩු විධාන සංග්‍රහයේ (101 පරිච්ඡේදයේ) 225(3) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය මූල්‍ය වෙත නිසි පරිදි නිකුත් කරන ලද ක්‍රියාත්මක කිරීමේ ආඥාවක් ලෙස සලකනු ලැබිය යුතු අතර, වෙනත් යම් ලිඛිත නීතියකට පටහැනිව, එය ක්‍රියාත්මක කිරීම අත්හිටුවනු නොලැබේ.

(ඊ) පනතේ මෙම කොටස යටතේ ආඥාවක් ක්‍රියාත්මක කරන අතරතුර පිස්කල් නිලධරයාට විරුද්ධ වන ඕනෑම තැනැත්තෙකු, තහනම් කිරීමට නියමිත උපකරණ වගඋත්තරකරු හැරුණු කොට වෙනත් පුද්ගලයෙකුට අයත් වන බව සනාථ කරන්නේ නම් මිස, අධිකරණයට අපහාස කිරීම සම්බන්ධයෙන් වරදකරුවෙකු ලෙස සලකනු ලබන අතර ඔහු මිලියනයකට නොවැඩි දඩයකට හෝ වසර දෙකකට නොවැඩි කාලයක් සඳහා සිරගත කිරීමට යටත් විය යුතුයග

(9)

(අ) මෙම පනත යටතේ ක්‍රියාත්මක කරන ලද ක්‍රියාවක නියෝගයක් සිතාමතා යටපත් කිරීම හෝ අදාළ යම් කරුණු අනාවරණය නොකිරීමෙන් ලබා ගත් බව අධිකරණයට පෙනී යන විට හෝ, එවැනි නියෝගයකට පිවිසීමෙන් පසු එම නියෝගය නිකුත් කර ක්‍රියාමාර්ගය නිෂ්ප්‍රභ කරන ලදුව, එම ක්‍රියාමාර්ගය තුළම, මෙම නියෝගයට පිවිසීම මගින් එවැනි පාර්ශ්වයක් වෙත හටගත් වියදම හෝ ඇති වූ තුවාල සඳහා සාධාරණ යැයි සැලකෙන වන්දි මුදලක් බදු දීමනාකරුට ප්‍රදානය කළ යුතු අතර, මෙම උපවගන්තිය යටතේ ඇති ප්‍රදානයත් නියෝගය වෙත පිවිසීමට අදාළව වන්දි ගෙවීම සඳහා සිදු කරනු ලබන ඕනෑම ක්‍රියාමාර්ගයක් තහනම් කරනු ලබයි.

(ආ) එවැනි ක්‍රියාවකට ඇතුළත් කරන ලද නියෝගයකට අදාළව (අ) යටතේ වන්දි ගෙවීම සඳහා ඉල්ලුම්පතක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක දී මෙම

| | | |
|---|---|---|
| | | පනත යටතේ ක්‍රියාත්මක කරන ලද යම් ක්‍රියාවක් ප්‍රතික්ෂේප කිරීමේ හැර, එසේ ප්‍රතික්ෂේප කරන ලද ක්‍රියාව එම අයදුම්පත්‍රය තීරණය කරන තෙක් අඛණ්ඩ ව පවතිනු ඇතැයි සලකනු ලැබිය යුතුය.<br><br>(10)<br><br>(අ) 29(1) වගන්තිය යටතේ නිකුත් කරන ලද නියෝගයකට ප්‍රතිචාර වශයෙන් කිසියම් වගඋත්තරකරුවෙකු හෝ ඊට වැඩි ගණනක් අධිකරණයේ පෙනී සිටින විට දී සහ එම නියෝගයට විරුද්ධ නොවී වගකීම පිළිගෙන උපකරණවල සන්තකය බදු දීමනාකරු වෙත භාර දී බදු දීමනාකරු විසින් හිමිකම් කියනු ලබන මුදල ඇවර කරන ලෙස ඉල්ලා සිටින විට දී, වාර්තාවේ මෙම කරුණ සටහන් කර ඉන් පසු නියෝගය ස්ථිර කළ යුතුය.<br><br>(ආ) වගඋත්තරකරුවෙක් වගකීම පිළිගෙන බදු දීමනාකරු විසින් ඉල්ලා සිටින මුදල ඇවර කරන ලෙස ඉල්ලා සිටින විට දී, පෙත්සම්කරුගේ කැමැත්ත ඇතිව, වගඋත්තරකරුට පෙත්සම්කරු විසින් ඉල්ලා සිටින මුදල වාරික වශයෙන් ගෙවීමට අධිකරණයට අවසර දිය හැකිය.<br><br>(11) යම් වෙනත් නීතියක පටහැනි කිසිවකට හැර, මෙම වගන්තිය යටතේ කරන ලද නියෝගයක්, නිර්ණයක්, තීරණයක්, මඟ පෙන්වීමක් හෝ අවශ්‍යතාවයක් සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද අයදුම්පතක් මත අභියාචනා කිරීමට අවසර ලබා දී ඇති අවස්ථාවක දී, මුල් අධිකරණයේ නඩු කටයුතු එවැනි අභියාචනයක් විභාග කරන අධිකරණය විසින් රඳවා තබා නොගත යුතු ය.<br><br>(12)<br><br>(a) (අ) ක්‍රියාවලිය සම්බන්ධ ව පනතේ මෙම කොටසෙහි විධිවිධාන සලසා නොමැති ඕනෑම කරුණක් හෝ ගැටලුවක දී, එම ක්‍රියාවලිය පනතෙහි මෙම කොටසෙහි විධිවිධානවලට පටහැනි නොවේ නම්, සිවිල් නඩු විධාන සංග්‍රහයේ (පරිච්ඡේද 101) දක්වා ඇති ක්‍රියාවලිය සමාලෝචන ක්‍රියාපටිපාටියට අයදුම් කිරීම පිළිබඳ වන එවැනි කාරණයක දී හෝ ගැටලුවක දී අධිකරණය විසින් අනුගමනය කළ යුතුය. |

| | | |
|---|---|---|
| | | (ආ) මෙම පනතේ කාර්යය සඳහා භාවිතා කළ යුතු යැයි කිසිදු පෝරමයක් නියම කර නොමැති අවස්ථාවේ දී, එවැනි කාර්යයක් සඳහා අධිකරණය විසින් අනුමත කරනු ඇති පෝරමය භාවිතා කළ හැකිය.<br><br>(13) බදු දීමනාකරු විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පතක් මත, එවැනි ඉල්ලුම්පත්‍රයක සඳහන් උපකරණ බදු දීමනාකරු විසින් නැවත පවරා ගැනීම වළක්වමින් බදුදීමනාකරු හෝ වෙනත් අයකු විසින් ඒවා සඟවා හෝ වසන් කර ඇති බවට අධිකරණය සෑහීමකට පත්වන්නේ නම්, එවැනි අධිකාරියක් හෝ ආයතනයක් යටතේ පැවරී ඇති ව්‍යවස්ථාපිත බලතල යටතේ, එවැනි උපකරණ භාවිතය සඳහා නිකුත් කරන ලද යම් බලපත්‍රයක් අලුත් කිරීම හෝ එම උපකරණ භාවිතය සඳහා නිකුත් කර ඇති ඕනෑම බලපත්‍රයක අයිතිය පැවරීම එම ආයතනය විසින් නතර කරනු ලැබීම සඳහා ඕනෑම රජයේ අධිකාරියකට හෝ රජයේ ආයතනයකට නියෝගයක් නිකුත් කිරීමට අධිකරණයට හැකිය. |
| 30 | 27 වන, 28 වන සහ 29 වන වගන්තිවල විධිවිධාන, කල්බදු මූල්‍යකරණයක් යටතේ යම් උපකරණයක සන්තකය හෝ අය විය යුතු යම් මුදලක් ආපසු ලබා ගැනීම සඳහා නීතියෙන් බදු දීමනාකරුට ඇති වෙනත් යම් ප්‍රතිකර්මයකට අතිරේකව මිස, එය හීන කිරීම සඳහා නොවිය යුතුය. | *වෙනසක් නොමැත.* |
| 31 | කල්බදු මූල්‍යකරණයක පාර්ශ්වකරුවන් විසින්, ඔවුන් අතර ඇතුළත් වූ කල්බදු මූල්‍යකරණයට, 11 වන, 16 වන, 22 වන හා 24 වන වගන්තිවල ඇතුළත් විධිවිධාන හැර, මේ පනතේ මේ කොටසේ විධිවිධාන අදාළ නොකිරීම සම්බන්ධයෙන්, ඒ බද්දේ විධිවිධාන සලස්වනු ලැබිය හැකි ය. | *අහෝසි කෙරේ.* |
| 32 | (1) මේ පනත යටතේ ලියාපදිංචි කිරීමක් ලබා නොගෙන යම් තැනැත්තකු කල්බදු මූල්‍යකරණ ව්‍යාපාරයක් පවත්වා ගෙන යන්නේ යැයි විශ්වාස කිරීමට තරම් අධ්‍යක්ෂවරයාට හේතු ඇති විටෙක, අධ්‍යක්ෂවරයා විසින් | *අහෝසි කර ප්‍රතිස්ථාපනය කෙරේ.* |

| | | |
|---|---|---|
| | හෝ අධ්‍යක්ෂවරයා විසින් බලය දෙන ලද යම් නිලධරයකු විසින් නිකුත් කරන ලද දැන්වීමක් මගින් එම කාරණය නිසැකව දැන ගැනීම සඳහා අවශ්‍ය යැයි අධ්‍යක්ෂවරයා සලකන යම් ලේඛන කිසිවක් ඉදිරිපත් කිරීම ද ඇතුළුව යම් තොරතුරක් සපයන ලෙස, ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකි ය.<br><br>(2) (1) වන උපවගන්තිය යටතේ සපයන ලද තොරතුරක් සලකා බැලීමෙන් හා ඉදිරිපත් කරන ලද ලේඛන කිසිවක් සලකා බැලීමෙන් පසුව මේ පනත යටතේ ලියාපදිංචි කිරීමකින් තොරව, අදාළ තැනැත්තා විසින් කල්බදු මූල්‍යකරණ ව්‍යාපාර කටයුත්තක් පවත්වා ගෙන යන බවට අධ්‍යක්ෂවරයා හෝ බලයලත් නිලධරයා සෑහීමට පත් වූ අවස්ථාවක, අධ්‍යක්ෂවරයා විසින් ඒ සඳහා නිකුත් කරන ලද ලිඛිත දැන්වීමක් මගින් ඒ කල්බදු මූල්‍යකරණ ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යාම වහාම නතර කරන ලෙස ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකි ය.<br><br>(3) (2) වන උපවගන්තිය යටතේ දැන්වීමක් නිකුත් කරන ලද්දේ යම් තැනැත්තකු වෙත ද ඒ තැනැත්තා විසින් දැන්වීමෙහි සඳහන් කාලය ඇතුළත දැන්වීමේ නියමවලට අනුකූලව කටයුතු කිරීම පැහැර හරිනු ලබන අවස්ථාවක, අධ්‍යක්ෂවරයා විසින්;<br><br>(අ) මේ පනත යටතේ වරදක් සඳහා ඒ තැනැත්තාට විරුද්ධව නඩු පැවරීම; සහ<br><br>(ආ) මේ පනත යටතේ තත් කාර්යය සඳහා වලංගු ලියාපදිංචි කිරීමක් ලබා ගන්නා තුරු කල්බදු මූල්‍යකරණ ව්‍යාපාර කටයුතු, පවත්වා ගෙන යැමෙන් ඒ තැනැත්තා වළක්වාලන ඉන්ජන්ෂන් තහනමක් සඳහා වූ ආඥාවක් ලබා ගැනීමට එම කල්බදු මූල්‍යකරණ ව්‍යාපාර කටයුතු කරගෙන යන පළාතේ පිහිටි පළාත්බද මහාධිකරණය වෙත ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය පියවර ගනු ලැබිය හැකි ය.<br><br>(4) එවැනි සෑම ඉල්ලීමක් ම එකී මහාධිකරණය වෙත ලියවිල්ලකින් අමතන ලද පෙත්සමක් මගින් කළ යුතු අතර, සිවිල් නඩු විධාන සංග්‍රහයේ | (1) මේ සම්බන්ධව මහ බැංකුවේ බලයලත් නිලධරයෙකුට, මෙම පනතේ 39(අ) වගන්තිය යටතේ වැරැද්දක් සිදු කරන පුද්ගලයෙකු පිළිබඳව ඕනෑම පැමිණිල්ලක් හෝ තොරතුරු ලැබෙන අවස්ථාවක දී, වැරදි විමර්ශනය කිරීම සඳහා වෙනත් ඕනෑම නීතියක් යටතේ පොලිස් නිලධරයෙකු හට පවරා තිබෙන බලතල සම්බන්ධව පූර්ව නිගමනයකින් තොරව, එවැනි බලයලත් නිලධරයෙකු විසින් එකී පැමිණිල්ල හෝ තොරතුරු පොලිස්පතිවරයා වෙත යොමු කර, එම පැමිණිල්ල හෝ තොරතුරු පිළිබඳව විමර්ශනයක් පැවැත්වීමට පොලිස්පතිවරයා වෙත ඉල්ලීම් සිදු කරනු ලැබිය යුතුය. එවැනි වරදක් සිදු කිරීම පිළිබඳව විමර්ශනය කිරීම හෝ විමර්ශනයක් සිදු කිරීමට සැලැස්වීම පොලිස්පතිවරයාගේ යුතුකම වන අතර, එවැනි විමර්ශනයක් තුළ දී මෙම පනත තුළ හෝ වෙනත් යම් ලිඛිත නීතියකින් විධිවිධාන සලස්වා ඇති විමර්ශනය කිරීමේ සියලු බලතල ක්‍රියාත්මක කිරීමට ඔහුට හැකියාව ඇත.<br><br>(2) ඉහත (1) වන උපවගන්තියෙහි විධිවිධාන කෙසේ වෙතත්, මෙම පනතෙහි 39(අ) වගන්තිය යටතේ යම් පුද්ගලයෙකු වරදක් සිදු කිරීමට අදාළව යම් කටයුත්තක නිරත වී සිටින බවට විශ්වාස කිරීමට පොලිස් නිලධරයෙකුට සාධාරණ හේතූන් ඇත්නම්, එවැනි නිලධරයෙකු විසින් එවැනි වරදක් සිදු කිරීම සම්බන්ධව විමර්ශනය කිරීම හෝ විමර්ශනයක් සිදු කිරීමට සැලැස්වීම සිදු කරනු ලැබිය හැකි අතර, මෙම පනත තුළ හෝ වෙනත් යම් ලිඛිත නීතියකින් විධිවිධාන සලස්වා ඇති විමර්ශනය කිරීමේ සියලු බලතල ක්‍රියාත්මක කිරීමට ඔහුට හැකියාව ඇත. |

| | | |
|---|---|---|
| | xxiv වන පරිච්ඡේදයේ දක්වා ඇති කාර්ය පටිපාටියට අනුකූලව විභාග කර නිශ්චය කරනු ලැබිය යුතු ය.<br><br>(5) (3) වන උපවගන්තිය යටතේ කරන ලද ඉල්ලීමක් සලකා බැලීමෙන් පසු, පනත යටතේ ලියාපදිංචි කරනු නොලැබ, කියන ලද කල්බදු මූල්‍යකරණ ව්‍යාපාර කටයුත්තක් පවත්වා ගෙන යනු ලබන බවට පළාත්බද මහාධිකරණය නිශ්චය කරනු ලබන අවස්ථාවක, ඒ කාර්යය සඳහා මේ පනත යටතේ වලංගු ලියාපදිංචි කිරීමක් ලබා ගන්නා තුරු ඒ ව්‍යාපාරය කර ගෙන යෑමෙන් ඒ තැනැත්තා වළක්වාලන ඉන්ජන්ෂන් තහනමක්, මහාධිකරණය විසින් නිකුත් කරනු ලැබිය යුතු ය. | |

| | | |
|---|---|---|
| 33 | (1) ලියාපදිංචි කරන ලද ආයතනයක පොත් හා ගිණුම්, තමා විසින් සඳහන් කරනු ලැබිය හැකි යම් වේලාවක හා ස්ථානයක දී පරීක්ෂා කර බැලීමේ බලය, අධ්‍යක්ෂවරයාට හෝ අධ්‍යක්ෂවරයා විසින් බලය දෙන ලද යම් නිලධරයකුට, ඇත්තේ ය.<br><br>(2) (1) වන උපවගන්තිය යටතේ වූ බලය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා, ලියාපදිංචි කරන ලද ආයතනයක කටයුතුවලට අදාළ පොත්, වාර්තා හෝ ලේඛන කිසිවක් දැනුම් දෙනු ලැබිය හැකි යම් ස්ථානයක දී පරීක්ෂා කර බැලීම සඳහා ඉදිරිපත් කරන ලෙස අධ්‍යක්ෂවරයා හෝ බලයලත් නිලධරයා විසින් ඒ ආයතනයට නියම කරනු ලැබිය හැකි අතර, ඒ නියමයට අනුකූලව කටයුතු කිරීම පැහැර හරින යම් ලියාපදිංචි කරන ලද ආයතනයක්, මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය. | *අහෝසි කර ප්‍රතිස්ථාපනය කෙරේ.*<br><br>මෙම පනත යටතේ විමර්ශනයක් සිදු කරන පොලිස් නිලධරයෙකුට අවශ්‍ය වූ විට යම් පුද්ගලයෙකු යම් තොරතුරක්, පොතක්, සටහනක්, ගොනුවක්, නාම ලේඛනයක් හෝ වෙනත් යම් ලියවිල්ලක් හෝ ද්‍රව්‍යයක් හෝ වස්තුවක් සැපයීමට අපොහොසත් වන අවස්ථාවේ දී හෝ වැරදි, සාවද්‍ය හෝ අසම්පූර්ණ තොරතුරක්, පොතක්, සටහනක්, ගොනුවක්, නාම ලේඛනයක් හෝ වෙනත් යම් ලියවිල්ලක් හෝ ද්‍රව්‍යයක් හෝ වස්තුවක් සපයන්නේ නම්, සහකාර පොලිස් අධීක්ෂක ශ්‍රේණියට පහළ ශ්‍රේණියක නොවන පොලිස් නිලධරයෙකු විසින් පහත ආකාරයේ ආඥාවක් නිකුත් කිරීම සඳහා මහේස්ත්‍රාත්වරයා වෙත ඉල්ලීමක් සිදු කරනු ලැබිය හැකිය-<br><br>(අ) පොලිස් නිලධරයා විසින් සිදු කරන ලද අවශ්‍යතාවත් සමඟ අනුකූල වීමට අපොහොසත් වී ඇති පුද්ගලයාගේ මුද්‍රිත, ඉලෙක්ට්‍රොනික හෝ වෙනත් යම් ආකාරයෙන් පවත්වා ගෙන ගිය යම් පොතක්, සටහනක්, ගොනුවක්, නාම ලේඛනයක් හෝ එවැනි යම් ලියවිල්ලක් හෝ ද්‍රව්‍යයක් හෝ වස්තුවක් සෝදිසි කිරීම සඳහා ඉල්ලුම් පත්‍රයෙහි නම් කර ඇති යම් නිලධරයෙකු සඳහා බලය ලබා දීම.<br><br>(ආ) පොලිස් නිලධාරීන් විසින් සිදු කරන ලද අවශ්‍යතාවක් සමඟ අනුකූල වීමට අපොහොසත් වී ඇති පුද්ගලයෙකු විසින් හෝ ආඥාවෙහි නම් කරන ලද එවැනි පුද්ගලයෙකුගේ, අධ්‍යක්ෂවරයෙකු, හවුල්කරුවෙකු, සාමාජිකයෙකු, ලේකම්වරයෙකු, කළමනාකරුවෙකු, සේවකයෙකු, නියෝජිතයෙකු, කොන්ත්‍රාත්කරුවෙකු හෝ විගණකයෙකු විසින් ආඥාවෙහි නියම කර ඇති ස්ථානයක දී මුද්‍රිත, ඉලෙක්ට්‍රොනික හෝ වෙනත් යම් ආකාරයෙන් පවත්වා ගෙන ගිය යම් පොතක්, සටහනක්, ගොනුවක්, නාම ලේඛනයක් හෝ එවැනි යම් ලියවිල්ලක් හෝ ද්‍රව්‍යයක් හෝ වස්තුවක් ඉදිරිපත් කරන ලෙසට නියම කිරීම. |
| 33අ | *නව විධිවිධානය* | (1) සහකාර පොලිස් අධීක්ෂක ශ්‍රේණියට පහළ ශ්‍රේණියක නොවන පොලිස් නිලධරයෙකු විසින් මෙම පනතේ 32 වන වගන්තියෙහි විමර්ශනය කෙරෙන පුද්ගලයෙකුගේ විදේශ ගමන් බලපත්‍රය අවහිර කිරීමට ඉල්ලීමක් ඕනෑම අවස්ථාවක දී මහේස්ත්‍රාත්වරයෙකු වෙත යොමු කරනු ලැබිය හැකිය. |

| | | |
|---|---|---|
| | | (2) 32 වන වගන්තිය ප්‍රකාරව විමර්ශනය කෙරෙනු ලබන පුද්ගලයා ආයතනයක් වන්නේ නම්, සහකාර පොලිස් අධීක්ෂක ශ්‍රේණියට පහළ ශ්‍රේණියක නොවන පොලිස් නිලධරයෙකු විසින්-<br><br>(අ) එම ආයතනය සංස්ථාපිත ආයතනයක් නම් එහි ඕනෑම අධ්‍යක්ෂවරයෙකු හෝ, කොටස්හිමියෙකු හෝ කළමනාකරුවෙකුගේ;<br><br>(ආ) එම ආයතනය එවැනි හවුල් ව්‍යාපාරයක් නම් එහි ඕනෑම හවුල්කරුවෙකුගේ; හෝ<br><br>(ඇ) එම ආයතනය හවුල් ව්‍යාපාරයක් නොවන සංස්ථාගත නොකරන ලද ආයතනයක් නම් එහි ඕනෑම සාමාජිකයෙකුගේ හෝ කළමනාකරණය සහ පාලනය සඳහා වගකියන නිලධරයෙකුගේ;<br><br>විදේශ ගමන් බලපත්‍රය අවහිර කිරීමට අවශ්‍ය ඉල්ලීමක් සිදු කරනු ලැබීම නීත්‍යානුකූල වේ. |
| 33ආ | *නව විධිවිධානය* | මෙම පනත යටතේ අර්ථය තුළ මූල්‍යකරණ කල්බදු ගනුදෙනුවක අරමුණ සඳහා එකඟ වී ඇති කල්බදු ගිවිසුමක ලක්ෂණ ඇති නමුත්, කල්බදු ගිවිසුමක් යන මාතෘකාවක් නොදරන ගිවිසුමක් හෝ මෙම පනත යටතේ කල්බදු ගිවිසුමක පාර්ශ්වයන්ගේ අයිතිවාසිකම් සහ වගකීම් ලෙස නිර්වචනය කර ඇති ගිවිසුමක පාර්ශ්වයන්ගේ අයිතිවාසිකම් සහ වගකීම් සඳහා විධිවිධාන සලස්වන ආකාරයේ ගිවිසුමක්, මෙම පනතේ අරමුණු සඳහා කල්බදු මූල්‍යකරණ ගිවිසුමක් ලෙස සැලකිය යුතු වේ. |
| 33ඇ | *නව විධිවිධානය* | මෙම පනතේ 32(1) වගන්තිය යටතේ පොලිස්පතිවරයා වෙත පවරා ඇති බලතල නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ ශ්‍රේණියට පහළ ශ්‍රේණියක නොවන නිලධරයෙකු වෙත පොලිස්පතිවරයා විසින් පවරා දෙනු ලැබිය හැකිය. |
| 33ඈ | *නව විධිවිධානය* | මෙම පනතේ 3 වන වගන්තියෙහි සඳහන් කර ඇති පුද්ගලයෙකු හැරුණු කොට, වෙනත් කිසිදු පුද්ගලයෙකු විසින් මණ්ඩලයේ පූර්ව ලිඛිත අනුමැතියකින් තොරව, එහි නාමයෙහි ‘‘කල්බදුකරණය‘‘, ‘‘කල්බද්ද‘‘ හෝ එහි වෙනත් යම් ව්‍යුත්පන්න, අක්ෂර පරිවර්තන හෝ වෙනත් යම් භාෂාවකින් ඒවාට සමාන වචන භාවිත කරනු නොලැබිය යුතුය. |

| | | |
|---|---|---|
| 34 | පහත දැක්වෙන කරුණු පිළිබඳ වූ විධාන ද ඇතුළුව, ස්වකීය කාර්යය කර ගෙන යෑමේ දී ලියාපදිංචි කරන ලද ආයතන විසින් කාර්යක්ෂම තත්ත්වයෙන් පවත්වා ගෙන යෑම වගබලා ගැනීමේ කාර්යය සඳහා අවශ්‍ය යැයි තමා සලකන, සාමාන්‍ය විධාන නිකුත් කිරීමේ බලය, අධ්‍යක්ෂවරයාට ඇත්තේ ය:—<br><br>(අ) ලියාපදිංචි කරන ලද ආයතන විසින් අය කරනු ලැබිය යුතු උපරිම ගෙවීම් ප්‍රමාණය;<br><br>(ආ) ගෙවීම් එකතු කිරීමේ ක්‍රමය හා සම්බන්ධ කරුණු;<br><br>(ඇ) ගිණුම් පොත් හෝ වෙනත් වාර්තා හෝ ලේඛන පවත්වා ගෙන යා යුතු ආකෘතිය හා ආකාරය;<br><br>(ඈ) කල්බදු මූල්‍යකරණයේ නියම හා කොන්දේසි;<br><br>(ඉ) එහි කල්බදු මූල්‍යකරණවල වටිනාකම සැලකිල්ලට ගනිමින් ලියාපදිංචි කරන ලද ආයතනයකට තිබිය යුතු අවම ගෙවා නිමි ප්‍රාග්ධන හා සංචිත;<br><br>(ඊ) ලියාපදිංචි ආයතනයක ගෙවා නිමි ප්‍රාග්ධනය සහ සංචිත සැලකිල්ලට ගනිමින්, අධ්‍යක්ෂවරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි කවර වූ හෝ එක් තැනැත්තකුට, තැනැත්තන් කණ්ඩායමකට හෝ තැනැත්තන් කොට්ඨාසයකට දෙනු ලබන කල්බදු මූල්‍යකරණවල උපරිම වටිනාකම;<br><br>(උ) ලියාපදිංචි කරන ලද ආයතනයේ ප්‍රාග්ධනය හා සංචිත;<br><br>(ඌ) යම් උපකරණයක් හෝ විවිධ වර්ගවල උපකරණ සඳහා බදු ගැනුම්කරුවකු විසින් කිරීමට නියමිත අවම ආරම්භක ගෙවීම; ඒ අවමය උපකරණයේ වටිනාකමෙහි ප්‍රතිශතයක් වශයෙන් ප්‍රකාශ කරනු ලැබිය යුතු ය; හෝ<br><br>(ඒ) බොල් හා අඩමාන ණය සම්බන්ධයෙන් විධිවිධාන | *අහෝසි කර ප්‍රතිස්ථාපනය කෙරේ.*<br><br>(1) මණ්ඩලය විසින් 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 12 වන වගන්තිය සහ 1988 අංක 30 දරන බැංකුකරණ පනතේ 46 සහ 76 ඒ වන වගන්ති යටතේ, පිළිවෙළින්, බලපත්‍රලාභී මුදල් සමාගම් සහ බලපත්‍රලාභී බැංකු වෙත එවැනි බලපත්‍රලාභී මුදල් සමාගම් සහ බලපත්‍රලාභී බැංකු විසින් කල්බදු මූල්‍යකරණ ව්‍යාපාර පවත්වා ගෙන යා යුතු ආකාරය සම්බන්ධව, විධාන නිකුත් කරනු ලැබිය හැකි අතර, එවැනි විධාන මෙම පනතේ විධිවිධාන සමඟ පරස්පර නොවිය යුතුය.<br><br>(2) මණ්ඩලය විසින් ක්ෂුද්‍ර මූල්‍ය සහ ණය නියාමන අධිකාරී පනතේ 59 (1) වගන්තිය යටතේ එම පනත යටතේ බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය ආයතන විසින් නියමිත ක්ෂුද්‍ර කල්බදු මූල්‍යකරණ ව්‍යාපාර පවත්වා ගෙන යා යුතු ආකාරය සම්බන්ධව ක්ෂුද්‍ර මූල්‍ය සහ ණය නියාමන අධිකාරිය වෙත මාර්ගෝපදේශ නිකුත් කරනු ලැබිය හැකිය. |

| | | |
|---|---|---|
| 35 | (1) නියම කරනු ලැබිය යුතු යයි මේ පනතින් නියමිත හෝ නියෝග සෑදිය යුතු යැයි මේ පනතින් බලය දී ඇති යම් කරුණක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.<br><br>(2) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, පළ කරනු ලැබූ දින හෝ නියෝගයෙහි එය සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය.<br><br>(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම, එය ගැසට් පත්‍රයෙහි පළ කිරීමෙන් පසු, හැකි පහසු ඉක්මනින් අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත නොකරන ලද එවැනි යම් නියෝගයක් එම අනුමැතියේ දින පටන් පරිච්ඡින්න කරන ලද ලෙස සලකනු ලැබිය යුතු මුත්, ඒ යටතේ කලින් කරන ලද යම් දෙයකට ඉන් හානියක් නොවිය යුතු ය.<br><br>(4) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරන ලද ලෙස සලකනු ලැබූ දින පිළිබඳ නිවේදනය, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය. | *අහෝසි කෙරේ.* |
| 36 | පනත යටතේ අධ්‍යක්ෂවරයා විසින් හෝ අධ්‍යක්ෂවරයා විසින් බලය දෙන ලද යම් නිලධරයකු විසින්, සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන්, අධ්‍යක්ෂවරයාට හෝ ඒ නිලධරයාට හෝ එරෙහිව සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය. | ‘‘අධ්‍යක්ෂවරයා‘‘ යන වචනය ‘‘මණ්ඩලය‘‘ යන වචනයෙන් ප්‍රතිස්ථාපනය කෙරේ. |
| 37 | අධ්‍යක්ෂවරයා විසින් හෝ අධ්‍යක්ෂවරයා විසින් බලය දෙන ලද යම් නිලධරයකු විසින් මේ පනත යටතේ ස්වකීය කාර්ය ඉටු කිරීමේ දී ලබා ගත් යම් තොරතුරක් හෝ කරුණක් අනාවරණය කිරීම,-<br><br>(අ) එසේ කිරීමට—<br><br>(i) අධිකරණයක් විසින්;<br><br>(ii) ඒ තොරතුරු හෝ කරුණ අදාළ වන තැනැත්තා විසින්, | ‘‘අධ්‍යක්ෂවරයා‘‘ යන වචනය ‘‘මණ්ඩලය‘‘ යන වචනයෙන් ප්‍රතිස්ථාපනය කෙරේ. |

| | | |
|---|---|---|
| | නියම කරනු ලැබූ විටක දී;<br><br>(ආ) මේ පනත යටතේ ස්වකීය කාර්ය ඉටු කිරීමේ දී; හෝ<br><br>(ඇ) මේ පනතේ හෝ වෙනත් යම් නීතියක, යම් විධිවිධානයකට අනුකූලව කටයුතු කිරීමේ දී<br><br>හැර, කරනු නොලැබිය යුතු ය. | |
| 38 | සෑම ලියාපදිංචි කරන ලද ආයතනයක් ම සහ සෑම විශේෂ කාර්ය ප්‍රවාහයක්ම, 1990 අංක 18 දරන ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය පනතේ අර්ථානුකූලව සහ එහි කාර්යය සඳහා ණය දෙන ආයතනයක් වශයෙන් සලකනු ලැබිය යුතු ය. | *අහෝසි කර ප්‍රතිස්ථාපනය කෙරේ.*<br><br>(1) පාරිභෝගික ණය පනත යටතේ එළැඹී ඇති කිසිදු ගිවිසුමක් කල්බදු මූල්‍යකරණ ගිවිසුමක් ලෙස වටහා ගැනීම, ප්‍රකාශ කිරීම හැඟවීමක් සිදු නොකළ යුත්තේ ය.<br><br>(2) පාරිභෝගික ණය පනත යටතේ එළැඹී ඇති සියලු ගිවිසුම්, එම ගිවිසුම් කල්බදු මූල්‍යකරණ ගිවිසුමක් නොවන බවට නිශ්චිතව සඳහන් කළ යුතු ය. |
| 39 | (අ) 2 වන වගන්තියේ විධිවිධාන උල්ලඝනය කරමින් කල්බදු මුල්‍යකරණ ව්‍යාපාර කටයුතු කරගෙන යන;<br><br>(ආ) 5 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන වලට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින;<br><br>(ඇ) 6 වන වගන්තිය මගින් නියම කරන ලද පරිදි වාර්ෂිකව ලියාපදිංචි කිරීමේ ගාස්තුව ගෙවීම පැහැර හරින;<br><br>(ඈ) 7 වන වගන්තිය යටතේ නියම කරන ලද විස්තර සැපයීම පැහැර හරින;<br><br>(ඉ) 8 වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් මෙහෙයුම් සංග්‍රහයේ හෝ සාංගමික සංස්ථා පත්‍රයේ හෝ ව්‍යවස්ථාවලියේ ඇතුළත් විස්තර වෙන කරන; හෝ | *අහෝසි කෙරේ.: (අ), (ආ), (ඇ), (ඈ), (ඉ), (ඊ)*<br><br>*පහත දෑ සමඟ ප්‍රතිස්ථාපනය කෙරේ:*<br><br>(අ) මෙම පනතේ 3 වන වගන්තියේ විධිවිධානවලට පටහැනිව, අවස්ථානුකූලව, මූල්‍ය කල්බදුකරණ ව්‍යාපාරයක් හෝ ක්ෂුද්‍ර මූල්‍ය කල්බදුකරණ ව්‍යාපාරයක් සිදු කර ගෙන යෑම;<br><br>(ආ) යළි සන්තක කර ගැනීම වළක්වන හෝ ඊට බාධා සිදු කරන ආකාරයෙන් උපකරණයක් සැඟවීම හෝ වසන් කිරීම, හෝ කිසියම් ආකාරයකින් උපකරණයට හානි සිදු කිරීම හෝ උපකරණයේ යම් කොටසක්, සම්බන්ධකයක් හෝ සංරචකයක් ඉවත් කිරීම; |

| | | |
|---|---|---|
| | (ඊ) මේ පනත යටතේ සාදන ලද කිසියම් නියෝගයක් උල්ලංඝනය කරන හෝ මේ පනත යටතේ නිකුත් කළ කිසියම් විධානයකට හෝ දැන්වීමකට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින.<br><br>සෑම තැනැත්තකුම, මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතුය.". | (ඇ) බදු දීමනාකරුගේ ලිඛිත අවසරයකින් තොරව, කල්බද්දට දෙන ලද උපකරණය භාවිත කිරීමේ හෝ සන්තකයේ අයිතිය වෙනත් යම් පුද්ගලයෙකු වෙත පැවරීම;<br><br>(ඈ) බදු දීමනාකරුගේ ලිඛිත අවසරයකින් තොරව කල්බදු මූල්‍යකරණය යටතේ අයිතිවාසිකම් සහ වගකීම් වෙනත් යම් පුද්ගලයෙකු වෙත පැවරීම; හෝ<br><br>(ඉ) බදු දීමනාකරු විසින් හඳුනා ගැනීමේ අරමුණු සඳහා උපකරණයක් මත අලවා හෝ සම්බන්ධ කර ඇති යම් හිමිකාරීත්ව මුද්‍රාවක්, හැඳුනුම් සංකේතයක් හෝ හඳුනා ගැනීමක් ඉවත් කිරීම, විකෘති කිරීම හෝ ඊට හානි කිරීම;<br><br>මෙම පනත යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් වේ. |
| 40 | ලියාපදිංචි කරන ලද ආයතනයක අධ්‍යක්ෂවරයකු, කළමනාකරුවකු, නිලධරයකු හෝ සේවා නියුක්තියකු වශයෙන්, -<br><br>(අ) ලියාපදිංචි කරන ලද ආයතනයේ යම් පොතක හෝ වාර්තාවක ඕනෑකමින් ව්‍යාජ සටහනක් කරන හෝ එසේ කිරීමට සලස්වන;<br><br>(ආ) ලියාපදිංචි කරන ලද ආයතනයේ යම් පොතක හෝ වාර්තාවක සටහනක් කිරීම ඕනෑකමින් ම අත්හරින හෝ එවැනි යම් සටහනක් ඕනෑකමින් ම අත්හැරීමට සලස්වන: හෝ<br><br>(ඇ) ලියාපදිංචි කරන ලද ආයතනයේ යම් පොතක හෝ වාර්තාවක සටහනක් ඕනෑකමින් ම වෙනස් කරන, එහි උධෘත ගනු ලබන, සඟවන හෝ විනාශ කරන, නැතහොත්, එවැනි යම් සටහනක් ඕනෑකමින් ම වෙනස් | *අහෝසි කර ප්‍රතිස්ථාපනය කෙරේ.*<br><br>(1) මෙම පනතෙහි 39(අ) වගන්තිය යටතේ වරදට වරදකරුවකු වන යම් තැනැත්තෙකු, මහේස්ත්‍රාත්වරයකු විසින් සිදු කරන ලද නඩු විභාගයකින් පසු, වරදකරු කරනු ලැබූ විට, අවුරුදු පහක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් මිලියන පහක් නොවැඩි වූ දඩයකට, නැතහොත් ඒ බන්ධනාගාරගත කිරීම හා දඩය යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතුය.<br><br>(2) මෙම පනතෙහි 39(ආ), 39(ඇ), 39(ඈ) හෝ 39 (ඉ) වගන්ති යටතේ වරදට වරදකරු වන යම් තැනැත්තෙකු මහේස්ත්‍රාත්වරයකු විසින් සිදු කරන ලද නඩු විභාගයකින් පසු, වරදකරු කරනු ලැබූ විට, අවරුදු තුනක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක |

| | | |
|---|---|---|
| | කිරීමට, එහි උධෘත ගැනීමට, සැඟවීමට හෝ, විනාශ කිරීමට සලස්වන, යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය. | බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් මිලියන තුනකට නොවැඩි වූ දඩයකට, නැතහොත් ඒ බන්ධනාගාරගත කිරීම හා දඩය යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතුය. |
| 41 | (1) මේ පනත යටතේ වරදකට වරදකරු වූ යම් තැනැත්තකු, මහේස්ත්‍රාත්වරයකු විසින්, ලඝු නඩු විභාගයකින් පසු, වරදකරු කරනු ලැබූ විට, අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් දසදහසකට නොඅඩු වූ සහ රුපියල් දෙසිය පනස් දහසකට නොවැඩි වූ දඩයකට, නැතහොත් ඒ බන්ධනාගාරගත කිරීම හා දඩය යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතුය.<br><br>(2) පුද්ගල මණ්ඩලයක් විසින් මේ පනත යටතේ වරදක් කරනු ලැබූ අවස්ථාවක, —<br><br>(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම්, ඒ සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයෙක්, කළමනාකරු හෝ ලේකම්;<br><br>(ආ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නොවන්නේ නම්, ඒ මණ්ඩලයේ සාමාජිකයකු වන සෑම පුද්ගලයෙක් ම; සහ<br><br>(ඇ) ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාරික ආයතනයක් නම්, ඒ ව්‍යාපාරික ආයතනයේ සෑම හවුල්කරුවකු ම,<br><br>අවස්ථාවෝචිත පරිදි ඒ අධ්‍යක්ෂවරයා කළමනාකරු, ලේකම්, පුද්ගලයා හෝ හවුල්කරු විසින්, තමාගේ දැනීමක් නොමැතිව ඒ වරද කර ඇති බව හෝ ඒ වරද කිරීමෙහි ලා එය වැළැක්වීමට නිසි සියලු උද්යෝගයෙන් ක්‍රියාකර ඇති බව ඔප්පු කරනු ලැබුවහොත් මිස, වරදට වරදකරු විය යුතු ය. | *(1) වන උපවගන්ති අහෝසි කෙරේ.* |
| 42 | (1) මුදල් මණ්ඩලයේ අනුමැතිය ඇතිව සහ මේ පනත යටතේ වරදක් කරන ලද අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගනිමින්, අධ්‍යක්ෂවරයා විසින් රුපියල් ලක්ෂයකට නොවැඩි මුදල් ප්‍රමාණයකට, ඒ වරද සමථයකට පත් කරනු ලැබිය හැකි ය. | *අහෝසි කෙරේ.* |

| | | |
|---|---|---|
| | (2) මේ වගන්තිය යටතේ යම් වරදක් සමථයකට පත් කිරීම චූදිතයා නිදොස් කිරීමකට බලපෑම ඇත්තේ ය. | |
| 43 | පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි, —<br><br>පුද්ගලයෙකුට අදාළව, “සමීප නෑයා“ යන්නෙන්, පුද්ගලයාගේ කලත්‍රයා හෝ යැපෙන දරුවකු අදහස් වේ;<br><br>“අධ්‍යක්ෂවරයා” යන්නෙන්, මුදල් මණ්ඩලය විසින් මේ පනත යටතේ කල්බදු මූල්‍යකරණ ආයතන සමාගම් අධීක්ෂණය පිළිබඳ විෂය භාර කර ඇති ශ්‍රී ලංකා මහ බැංකුවේ දෙපාර්තමේන්තුවේ, ප්‍රධානියා අදහස් වේ;<br><br>“උපකරණය” යන්නේ, ආර්ථික වශයෙන් අවුරුදු එකකට වඩා වැඩි ඵලදායී ජීවිත කාලයක් ඇති යම් ස්පෘශ්‍ය වත්කමක් අදහස් වන අතර, ඉඩමක් සහ සැලකිය යුතු හානියක් නොමැතිව ඉඩමෙන් ඉවත් කරනු ලැබිය හැකි වූ යම් සවි කිරීමක් හෝ නිශ්චල දේපළක් නොවන, ඉඩමේ කරන ලද වැඩිදියුණු කිරීමක්, එයට ඇතුළත් නොවේ.<br><br>“කල්බදු මූල්‍යකරණය” යන්නෙන්,<br><br>(අ) ගිවිසුමේ දින පටන් අවුරුදු එකකට නොඅඩු ආරම්භක කාල පරිච්ඡේදයක් සඳහා, බදු ගැණුම්කරු විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන සහ බදු දීමනාකරු විසින් හෝ බදු ගැණුම්කරු විසින් තෝරා ගනු ලබන සැපයුම්කරුවකු විසින් සපයනු ලබන, උපකරණයක සන්තකය සහ භාවිතය බදු ගැනුම්කරු විසින් ලබා ගැනීම සඳහා;<br><br>(ආ) ඒ උපකරණයේ සන්තකය හා භාවිතය සම්බන්ධයෙන්, උපකරණයේ මිල සම්පූර්ණයෙන් ම හෝ ඉන් ප්‍රමාණවත් කොටසක් ණයට හිලව් කිරීම විශේෂයෙන් ම සැලකිල්ලට ගත හැකිවන පරිදි, ගනන් බැලිය යුතු මුදල් ප්‍රමාණ බදු ගැණුම්කරු විසින් බදු දීමනාකරුට ගෙවීම සඳහා;<br><br>(ඇ) බදු ගැනුම්කරු විසින් උපකරණය භාර ගැනීමෙන් පසුව, (අ) ඡේදයෙහි දක්වා ඇති ආරම්භක කාලපරිච්ඡේදය තුළ දී බදු ගැනුම්කරු විසින් අවසන් කරනු නොලැබිය හැකි; සහ | *අහෝසි කෙරේ:*<br><br>*“සමීප නෑයා“, “අධ්‍යක්ෂවරයා“, “කල්බදු මූල්‍යකරණ ව්‍යාපාර කටයුතු“, “මුදල් මණ්ඩලය“*<br><br>*“සැපයුම්කරු“* “නමුත් එවැනි උපකරණ සපයන බදු ගැනුම්කරුවෙකු ඇතුළත් නොවේ“.<br><br>*ඇතුළත් කෙරේ:*<br><br>“මණ්ඩලය“ යන්නෙන් මුදල් නීති පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය යන්න අදහස් කෙරේ.<br><br>“මූල්‍ය කල්බදුකරණය“ යන්නෙන් බදු ගැනුම්කරුවෙකු සහ බදු දීමනාකරුවෙකු අතර පහත දෑ සඳහා පවතින ගිවිසුමක් යන්න අදහස් කෙරේ;<br><br>(අ) බදු දීමනාකරු විසින් හෝ බදු ගැනුම්කරු විසින් තෝරා ගනු ලබන සැපයුම්කරුවෙකු විසින් හෝ හිමිකාරීත්වය බදු ගැනුම්කරු විසින් බදු දීමනාකරු වෙත පවරා ඇති උපකරණයක් හෝ නිශ්චිතව දක්වනු ලබන උපකරණයක්, ගිවිසුම් දිනයේ සිට වසරකට නොඅඩු ආරම්භක කාලයක් සඳහා බදු ගැනුම්කරු විසින් සන්තකය සහ භාවිතය සඳහා බදු ගැනුම්කරුවෙකු වෙත ලබා දීම;<br><br>(ආ) කල්බද්ද ක්‍රියාත්මක කරනු ලබන අවස්ථාවේ දී, බදු දීමනාකරු විසින්, අවස්ථානුකූලව, සැපයුම්කරු හෝ බදු ගැනුම්කරු වෙත කල්බද්ද පූර්ණ වශයෙන් ගෙවීම තුළින් සම්පූර්ණ උපකරණයේ හිමිකාරීත්වය බදු දීමනාකරු සතු වීම,<br><br>(ඇ) බදු ගැනුම්කරු විසින් උපකරණයේ සන්තකයට අදාළව සියලු ප්‍රතිලාභ භුක්ති විඳිනු ලබන සහ සියලු අවදානම් දරා ගනු ලබන, පවසන ලද කාලය තුළ දී බදු දීමනාකරු විසින් උපකරණයේ සන්තකය සහ භාවිතය සඳහා පවතින අයිතිය බදු ගැනුම්කරු වෙත පැවරීමට භාර ගැනීම; |

| | | |
|---|---|---|
| | (ඇ) 1982 අංක 29 දරන පාරිභෝගික ණය පනතේ අර්ථානුකූලව එය කුලී සින්නක්කර ගිවිසුමක් නොවන නමුදු, (අ) ඡේදයෙහි දක්වා ඇති ආරම්භක කාල පරිච්ඡේදය හෝ මේ ඡේදය යටතේ දීර්ඝ කරන ලද කාල පරිච්ඡේදය ඉකුත් වීමෙන් පසුව බදු ගැනුම්කරු විසින් මිලට ගැනීම සඳහා,<br><br>බදු දීමනාකරු හා බදු ගැනුම්කරුවකු අතර වූ ගිවිසුමක්, අදහස් වේ;<br><br>"කල්බදු මූල්‍යකරණ ව්‍යාපාර කටයුතු" යන්නෙන්, කල්බදු මූල්‍යකරණයක් යටතේ උපකරණ සැපයීම සඳහා මුදල් ආයෝජනය කිරීමේ ව්‍යාපාරයක් අදහස් වේ;<br><br>කල්බදු මූල්‍යකරණයකට අදාළව "බදු දීමනාකරු" යන්නෙන්, කල්බද්ද යටතේ උපකරණයක සන්තකයේ හා භාවිතයේ අයිතිය බදු ගැණුම්කරුවකු වෙත පවරන තැනැත්තා අදහස් වේ;<br><br>කල්බදු මූල්‍යකරණයකට අදාළව "බදු ගැනුම්කරු" යන්නෙන්, කල්බද්ද යටතේ උපකරණයක සන්තකයේ හා භාවිතයේ අයිතිය අත්කර ගනු ලබන තැනැත්තකු අදහස් වේ;<br><br>"මුදල් මණ්ඩලය" යන්නෙන්, මුදල් නීති පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය අදහස් වේ;<br><br>"සුරැකුම්කරණය" යන්නෙන්, බදුදීමනාකරුවකු විසින් විශේෂ කාර්ය ප්‍රවාහකයක් වෙත පවරන ලද හෝ භාර දෙන ලද කල්බදු මූල්‍යකරණයක හෝ කල්බදු මූල්‍යකරණයක විෂය වස්තුව සංයුක්ත වූ යම් උපකරණයක හෝ ඒ දෙකෙහිම අයිතිවාසිකම් වලින් යම් අයිතිවාසිකමක් හෝ සියලුම අයිතිවාසිකම් වලින් ආවරණය කර ඇත්තා වූ, විශේෂ කාර්ය ප්‍රවාහකයක් විසින් සුරැකුම්පත් නිකුත් කිරීම අදහස් වේ;<br><br>"විශේෂ කාර්ය ප්‍රවාහකය" යන්නෙන්, හුදු සුරැකුම්කරණය කිරීමේ කාර්ය සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ එයට ආනුෂංගික කටයුතු සඳහාම පමණක් පිහිටුවන ලද, භාරයක් ද ඇතුළුව, සංස්ථාපිත හෝ සංස්ථාපිත නොවන පුද්ගල මණ්ඩලයක් අදහස් වේ; | (ඈ) උපකරණයෙහි සන්තකය අත්පත් කර ගැනීමේ දී බදු දීමනාකරුට අය වූ පිරිවැය සහ අදාළ යම් ගිණුම්කරණ ප්‍රමිතියක් යටතේ කල්බදුකරණයෙහි ඇතුළත් ව පවතින පොලිය සහ බදු ගැනුම්කරුගෙන් අයකර ගත හැකි වෙනත් ගාස්තු ඇතුළත් විය යුතු,මෙම උපකරණයෙහි පූර්ණ පිරිවැයෙහි විශේෂයෙන් ම ක්‍රමක්ෂය සලකා බැලෙන පරිදි බදු ගැනුම්කරු විසින් සන්තකය සහ භාවිතය සඳහා ගණනය කිරීමට නියමිත එවැනි අගයන්ගෙන් සමන්විත එවැනි උපකරණවල භාවිතය සඳහා බදු දීමනාකරු වෙත සිදු කරනු ලබන ගෙවීම;<br><br>(ඉ) මෙම ඡේදය යටතේ (අ) ඡේදයෙහි දක්වා ඇති ආරම්භක කාලය දීර්ඝ කිරීම සඳහා විධිවිධාන සලස්වා ඇති හෝ විධිවිධාන සලස්වා නැති හෝ (අ) ඡේදයෙහි දක්වා ඇති ආරම්භක කාලය හෝ මෙම ඡේදය යටතේ දීර්ඝ කරන ලද කාලය කල් ඉකුත්වීමෙන් පසු බදු ගැනුම්කරු විසින් උපකරණය මිල දී ගැනීම සඳහා විධිවිධාන සැලැස්වීම<br><br>"දෙපාර්තමේන්තු ප්‍රධානියා" යන්නෙන්;<br><br>(අ) ශ්‍රී ලංකා යුධ හමුදාවේ, නාවික හෝ ගුවන් හමුදාවේ යම් ඒකකයක සාමාජිකයෙකුට අදාළව භාවිත කිරීමේ දී, එම ඒකකයේ අණදෙන නිලධාරීවරයා යන්න අදහස් කෙරේ;<br><br>(ආ) පළාත් සභාවේ රැකියාවෙහි නියුතු පුද්ගලයෙකුට අදාළව භාවිත කිරීමේ එම පළාත් සභාවේ ලේකම් යන්න අදහස් කෙරේ;<br><br>(ඇ) පළාත් මහජන සේවයෙහි නියුතු පුද්ගලයෙකුට අදාළව භාවිත කිරීමේ දී, එම පුද්ගලයා සේවයෙහි නිරත වී සිටින දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා යන්න අදහස් කෙරේ;<br><br>(ඈ) පළාත් පාලන ආයතනයක සේවයෙහි නිරත පුද්ගලයෙකුට අදාළව භාවිත කිරීමේ දී, එම ආයතනය මහ නගර සභාවක් වන්නේ නම්, එම මහ නගර සභාවෙහි නාගරික කොමසාරිස්වරයා යන්න අදහස් කෙරෙන අතර, එම ආයතනය නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් වන්නේ නම්, ඉන් එම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා යන්න අදහස් කෙරේ; |

| | | |
|---|---|---|
| | "සැපයුම්කරු" යන්නෙන්, කල්බදු මූල්‍යකරණයක කාර්යය සඳහා, උපකරණයක් සපයන තැනැත්තකු අදහස්වන නමුත්, එවැනි උපකරණයක් බදු ගැනුම්කරු විසින් ම සපයන අවස්ථාවක, එම බදු ගැනුම්කරුවකු ඇතුළත් නොවේ;<br><br>"සැපයුම් ගිවිසුම" යන්නෙන්, කල්බදු මූල්‍යකරණයක් යටතේ සැපයුම්කරු විසින් උපකරණයක් සැපයීම සඳහා බදු දීමනාකරුවකු සැපයුම්කරුවකු සමඟ ඇතුළත් වූ ගිවිසුමක් අදහස් වේ. | (ඉ) වෙනත් යම් මහජන නිලධරයෙකුට අදාළ භාවිත කිරීමේ දී, එවැනි පුද්ගලයෙකු රැකියාවෙහි නියුතු රජයේ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා යන්න අදහස් කෙරේ.<br><br>"ක්ෂුද්‍ර මූල්‍ය සහ ණය නියාමන අධිකාරිය" යන්නෙන් ක්ෂුද්‍ර මූල්‍ය සහ ණය නියාමන අධිකාරී පනත යටතේ පිහිටුවන ලද අධිකාරිය යන්න අදහස් කෙරේ.<br><br>"ක්ෂුද්‍රමූල්‍ය සමාගමක්" යන්නෙන් ක්ෂුද්‍ර මූල්‍ය සහ ණය නියාමන අධිකාරී පනත යටතේ බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය සමාගමක් යන්න අදහස් කෙරේ.<br><br>"ක්ෂුද්‍ර මූල්‍ය කල්බදු ව්‍යාපාරය" යන්නෙන් අඩු ආදායම් උපයන පුද්ගලයන් සහ ක්ෂුද්‍ර ව්‍යවසායයන් වෙත, කල්බදු මූල්‍යකරණයක් යටතේ උපකරණ සැපයීම සඳහා මුදල් ආයෝජනය කිරීමේ ව්‍යාපාරයක් අදහස් කෙරේ.<br><br>"අභිමත භාෂාව" යන්නෙන් සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි යන භාෂාවලින් එකක් යන්න අදහස් කෙරේ.<br><br>"ක්‍රියාවලි නිලධරයා" යන්නෙන් යළි සන්තක කර ගැනීමේ ආඥාව බාර දුන් බල ප්‍රදේශය අයත් අධිකරණයේ පිස්කල් නිලධාරියාගෙන් සුවිශේෂී අවස්ථා මත අධිකරණය විසින් නිවේදනය භාර දීම සඳහා විශේෂයෙන් බලය පවරන ලද ඕනෑම නිලධාරියෙකු හෝ ග්‍රාම නිලධාරියෙකු අදහස් කෙරේ.<br><br>"සැපයුම් ගිවිසුම" යන්නෙන් කල්බදු මූල්‍යකරණයක් යටතේ සැපයුම්කරුවකු විසින් උපකරණයක් සැපයීම සඳහා බදු දීමනාකරු, බදු ගැනුම්කරු සහ සැපයුම්කරු අතර ඇති කර ගන්නා ගිවිසුමක් යන්න අදහස් කෙරේ. |
| 44 | (1) නියමිත දින වන විට කල්බදු මූල්‍යකරණ ව්‍යාපාර කටයුතු කර ගෙන යාමෙහි නිරතව සිටින සෑම තැනැත්තෙක් විසින් ම, මේ පනතේ 2 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, ඒ නියමිත දින පටන් අවුරුදු එකක් නොඉක්මවන කාල පරිච්ඡේදයක් සඳහා ඒ ව්‍යාපාර කටයුතු නොකඩවා කර ගෙන යා හැකි නමුත් ඒ කල්බදු මූල්‍යකරණ ව්‍යාපාර කටයුතු කර ගෙන යාම සඳහා ඒ කාල පරිච්ඡේදය ඇතුළත මේ පනත යටතේ ලියාපදිංචි සහතිකයක් ඉල්ලුම්කර ලබා ගත යුතු ය. | *වෙනසක් නොමැත.* |

| | | |
|---|---|---|
| | (2) (1) වන උපවගන්තියේ සඳහන් තැනැත්තකු—<br><br>(අ) මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ ලියාපදිංචි කිරීමට පෙර, ඒ තැනැත්තා ඇතුළත් වූ සියලු කල්බදු මූල්‍යකරණ මේ පනත යටතේ ඇතුළත් වූ කල්බදු මූල්‍යකරණයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, එවැනි සෑම බදු දීමක් සඳහා සහ ඊට අදාළව මේ පනතේ විධිවිධාන එපරිද්දෙන් අදාළ විය යුතු ය; නැතහොත්,<br><br>(ආ) මේ පනත යටතේ ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් නොකරන්නා වූ හෝ ලියාපදිංචිය ප්‍රතික්ෂේප කරනු ලැබ ඇත්තා වූ හෝ අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි (1) වන උපවගන්තියේ සඳහන් කාලපරිච්ඡේදය ඉකුත් වීමට පෙර හෝ ප්‍රතික්ෂේප කිරීමේ දිනට පෙර, ඒ තැනැත්තා ඇතුළත් වූ යම්තාක් වූ කල්බදු මූල්‍යකරණ පමණක්, ඒවා ඇතුළත් වූ කාලපරිච්ඡේදය සඳහා වලංගුව පැවතිය යුතු ය. | |
| 44අ | (1) ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන වල කුමක් සඳහන් වුව ද, එම උපවගන්තියේ නියම කර ඇති කාල පරිච්ඡේදය ඇතුළත ඒ උපවගන්තිය යටතේ ලියාපදිංචි වීමට නියම කර තිබූ සහ මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට ලියාපදිංචි වීමක් ලබා නොගත් තැනැත්තකු -<br><br>(අ) ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ වරදක් සිදු කරනු ලැබ ඇති බවට සලකනු නොලැබිය යුතු අතර, ඒ අනුව ඒ තැනැත්තා විසින් ඇතුළත් වූ ගිවිසුම් කිසිවක් වලංගු ලෙසට සලකනු ලැබිය යුතුය;<br><br>(ආ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට අවුරුදු දෙකක කාල පරිච්ඡේදයක් සඳහා කල්බදු මූල්‍යකරණ ව්‍යාපාර කටයුතු නොකඩව කරගෙන යාමට හැකිය; සහ<br><br>(ඇ) මේ වගන්තියේ (2) වන උපවගන්තියේ විධි විධාන වලට යටත්ව, ඒ තැනැත්තාට එම කල්බදු මූල්‍යකරණ ව්‍යාපාර කටයුතු නොකඩව කරගෙන යාම සඳහා මෙම වගන්තියේ (ආ) ඡේදයේ සඳහන් කරන ලද කාල පරිච්ඡේදය ඇතුළත, ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි සහතිකයක් ඉල්ලුම්කර ලබාගත යුතු බවට නියම කරනු ලැබිය යුතු ය. | *වෙනසක් නොමැත.* |

| | | |
|---|---|---|
| | (2) මේ පනතේ 3 වන වගන්තියේ (ඇ) ඡේදය යටතේ අවම නිකුත් කළ සහ ගෙවා නිමි ප්‍රාග්ධනය ලෙස නියම කරන ලද ප්‍රමාණය නොඉක්මවන්නා වූ. නියම කරන ලද අවම නිකුත් කළ සහ ගෙවා නිමි ප්‍රාග්ධන ප්‍රමාණයක් ඇති, 1982 අංක 17 දරන සමාගම් පන්ත යටතේ සංස්ථාපිත පොදු සමාගමක් වේ නම් මිස ඒ තැනැත්තා මේ වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ ලියාපදිංචි කරනු ලැබීමට සුදුසුකම් නොලැබිය යුතු ය.<br><br>(3) මේ වගන්තිය යටතේ ලියාපදිංචි කිරීමක් සඳහා කරන සෑම ඉල්ලීමක් සමගම -<br><br>(අ) ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තියේ සඳහන් කරන ලද ලේඛන;<br><br>(ආ) ඉල්ලීම භාරදීමේ දිනට පෙරාතුව ම වූ වර්ෂය සඳහා වන විගණන ශේෂ පත්‍රයේ සහ ලාභ අලාභ ගිණුමේ පිටපතක්; සහ<br><br>(ඇ) නියම කරන ලද ගාස්තුව.<br><br>ඉදිරිපත් කළ යුතුය.<br><br>(4) (3) වන උපවගන්තියේ සඳහන් කරන ලද ලේඛනවලට අමතරව, තමා විසින් අවශ්‍ය යයි තීරණය කරනු ලැබිය හැකි වැඩි දුරටත් වූ ලේඛන කිසිවක් හෝ තොරතුරු ලබාදෙන ලෙසට අධ්‍යක්ෂවරයා විසින් ඉල්ලුම්කරුගෙන් ඉල්ලා සිටිය හැකි අතර, එවැනි ඉල්ලීමකට අනුකූලව කටයුතු කිරීම ඉල්ලුම්කරුගේ කාර්යය විය යුතුය.<br><br>(5) 44 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන මේ වගන්තියේ (1) වන වගන්තියේ සඳහන් කරන ලද තැනැත්තකු සම්බන්ධයෙන් අදාළ විය යුතුය.<br><br>(6) අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව. අධ්‍යක්ෂවරයා විසින් තත්කාර්ය සඳහා නිකුත් කරනු ලබන දැන්වීමක් මගින් එහි නිශ්චිතව සඳහන් කර ඇති කාල සීමාව ඇතුළත, ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කර ඇති යම් ප්‍රමාණයකට මේ වගන්තිය යටතේ ලියාපදිංචි තැනැත්තකුගේ අවම නිකුත් කළ සහ ගෙවා නිමි ප්‍රාග්ධනය වැඩි කිරීමට මේ වගන්තිය යටතේ ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකි ය. එසේ වුවද, වැඩි කරන ලද ඒ අවම | |

| | | |
|---|---|---|
| | නිකුත් කළ සහ ගෙවා නිමි ප්‍රාග්ධනය, 3 වන වගන්තියේ (ඇ) ඡේදය යටතේ නියම කරන ලද ප්‍රමාණයට වැඩි නොවිය යුතුය.<br><br>(7) යම් ලියාපදිංචි තැනැත්තකු විසින් (6) වන උපවගන්තිය යටතේ කරන ලද යම් නියමයකට අනුකූලවීම පැහැර හරින අවස්ථාවක දී, දැන්වීමෙහි ඇතුළත් නියමයට අනුකූල වන තෙක්, එම තැනැත්තා විසින් කරගෙන යනු ලබන කල්බදු මුල්‍යාකරණ ව්‍යාපාර කටයුතු හෝ වෙනත් යම් ගනුදෙනු කටයුතු, සීමා කිරීමට හෝ සීමිත කිරීමට අධ්‍යක්ෂවරයාට බලය ඇත්තේය. | |
| සංක්‍රාන්ති වගන්ති<br><br>(44 ආ) | *නව විධිවිධානය* | මෙම සංශෝධන බලාත්මක වීමේ දිනයට පෙර නිසි ලෙස ඇති කර ගත් සැපයුම් ගිවිසුමක් හෝ මූල්‍ය කල්බදුකරණයක් සඳහා මෙම සංශෝධන පනතෙහි විධිවිධාන අදාළ නොවිය යුතුය.<br><br>කෙසේ වෙතත්, මෙම සංශෝධන බලාත්මක වන දිනයේ සිට ඇති කරගනු ලබන ඕනෑම ගිවිසුමකට අයත් යම් පරිශිෂ්ටයක් මෙම සංශෝධනවලට යටත් විය යුතු වේ.<br><br>"කල්බදුකරණය", "කල්බද්ද" යන වචන හෝ එහි යම් ව්‍යුත්පන්නවල වචන, ඒවායෙහි අක්ෂර පරිවර්තන, හෝ ඒවාට සමාන වන යම් වෙනත් භාෂාවක වචන භාවිත කරන යම් පුද්ගලයෙකු, මෙම සංශෝධන පනතෙහි ආරම්භක දිනයේ සිට සය මසක් ඇතුළත, 33ඈ වන වගන්තිය සමඟ අනුකූල වීම සඳහා එවැනි නම් වෙනස් කළ යුතුය. |
| 45 | මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. | *වෙනසක් නොමැත.* |